# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2017

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
එම්. ඩී. එච්. ජයවර්ධන මාවත
අතුරුගිරිය

දුරකථනය : 011 - 2770232
ෆැක්ස් : 011 - 2798775
විද්‍යුත් තැපෑල : nipm@sltnet.lk/nipd@sltnet.lk
වෙබ් : www.nipm.gov.lk

| පටුන | පිටු අංකය |
|---|---|
| දැක්ම හා මෙහෙවර ප්‍රකාශය | 4 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 5 |
| අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිළධාරීතුමාගේ සමාලෝචනය | 6 - 8 |
| සංස්ථාපනික වාර්තාව සහ පරමාර්ථ | 9 - 10 |
| ප්‍රධාන පාලක මණ්ඩලයේ වාර්තාව | 10 -11 |
| පාලක මණ්ඩලයේ සංයුතිය | 11 |
| විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව | 11 -13 |
| ආයතනයේ කාර්ය මණ්ඩලය | 13 -17 |
| පරිපාලන සමාලෝචනය | 17 |
| සංවිධාන සටහන | 18 |
| ආයතනයේ මූලික ක්‍රියාකාරකම් | 19 -21 |
| පුහුණු වැඩ සටහන් වල ප්‍රගති සමාලෝචනය | 21 -32 |
| වෘත්තීය සාමාජිකත්වය | 33 |
| ප්‍රකාශන | 34 |
| ආයතනය සපයන පහසුකම් | 34 -36 |
| අපගේ ක්‍රියාකාරකම් | 36 - 39 |
| මූල්‍ය සමාලෝචනය | 40 -45 |
| ආයතනය මුහුණ දුන් සංරෝධන | 45 - 46 |
| සමාප්තිය | 47 |

# දැක්ම

වැව්ලි කළමනාකරණය පිලිබඳ පුහුණුව හා උපදේශන සැපයීම සහ සමීක්ෂණ පැවැත්වීමේ විශිෂ්ඨ ආයතනය බවට පත්වීම.

# මෙහෙවර

ගුණාත්මක පුහුණුව තුලින් වැවිලි කර්මාන්තයේ සියලුම මානව වත්කම්හි වෘත්තිය නිපුණතාවය පරිපූර්ණත්වය දෙසට ඉහළ නැංවීම

## සභාපතිතුමාගේ පණිවිඩය



2017 වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් සටහන් කිරීම, මට ඉමහත් සතුටකි. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මගින් සිදු කරනු ලබන අධ්‍යාපනික ක්‍රියාකාරකම් එහි සුවිශේෂී ජාතික පැතිකඩක් පවත්වාගෙන යමින් සිටී. මෙය අප විසින් පවත්වාගෙන යනු ලබන වැඩසටහන්, ඒ සඳහා ලැබෙන ප්‍රතිචාරයන් හා පෞද්ගලික පාර්ශවයන් ආකර්ෂණය කර ගැනීමේදී හා අපගේ අධ්‍යාපනික කාර්ය මණ්ඩලය තුළින් ලබා ගන්නා ලද දායකත්වය මගින් පිළිඹිබු කෙරේ. ජාතික හා ගෝලීය වශයෙන් ශක්තිමත් අධ්‍යාපනික තරඟකරුවකු වීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් ජාතික හා ගෝලීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනය වන අභියෝගයක් අපේක්ෂා කළ යුතු අතර, ඒ සඳහා පර්යේෂණ ධාරිතාව, ඉගැන්වීමේ ක්‍රමවේද හා ආයතනයේ කීර්තිනාමය වැඩි දියුණු කර ගත යුතුය. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලය හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ ආකල්ප සංවර්ධනයට අදාළව උපාය මාර්ගික සහය ලබා ගැනීම සඳහා වැඩි වශයෙන් ආයෝජනය කරනු ලබයි

කර්මාන්ත අංශයේ තිරසරභාවය හා නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා ආයතනය විසින් පවත්වනු ලබන විවිධ වැඩසටහන් සඳහා සහභාගීවන්නන් 13000 කට අධික සංඛ්‍යාවක් ලඟාකර ගැනීම යන ඉලක්කය සපුරා ගැනීමෙහි ලා 2017 වසරේ සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත. ආයතනයේ අධ්‍යාපනික හා ඉගැන්වීම් ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය කරුණක් වේ.

කර්මාන්ත අංශයේ තිරසරභාවය හා නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය කරුණක් වේ. ඒ සඳහා උපාධි පාඨමාලා 03 ක් සංවර්ධනය කරන අතරම කාර්මික තිරසාරත්වය පිළිබඳ මානව සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සැලසුම් කරයි.

අවසානයේදී, මෙම ආයතනයේ සංවර්ධනය උදෙසා මහත් සහයෝගයක් ලබා දුන් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාටද, අමාත්‍යාංශ ලේකම්තුමාට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තූතිය පිරිනමමි. එමෙන්ම ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂතුමාට ද එම ආයතනයේ සියලුම සාමාජිකයන්ට ද ප්‍රගතිශීලි මූල්‍ය වසරක් වෙනුවෙන් කරනු ලැබූ කැපවීම් සඳහා ස්තූතිය පිරිනමමි.



**දීප්ති අශෝක අබේවික්‍රම**

**සභාපති**

27.03.2018

## අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය



### අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනය

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය 1979 වසරේදී, වර්ධනය වෙමින් පවතින වැව්ලි කළමනාකරණ ක්ෂේත්‍රයේ නිපුණතා විදහා දැක්වීම සඳහා පුද්ගලයන් පුහුණු කිරීමේ අරමුණින් ස්ථාපනය කරන ලදි. එතැන් සිට අප ආයතනය විසින් කළමනාකරුවන්, වතු අධිකාරීවරුන්, වෘත්තිකයින් හා විද්‍යාඥයින් බිහි කිරීමෙහි ලා කැපී පෙනෙන වාර්තාවන් තබා ඇත.

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයෙහි අධ්‍යාපනය ලබන සිසුන්, ඔවුන්ගේ වෘත්තිමය ජීවිතය තුළ නව උපරිමයන් කරා ළඟා වීමට හැකි වන පරිදි ජීවිතයේ හැරවුම් අත්දැකීම් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබයි. වර්තමාන සංවර්ධනයන්ට පමණක් නොව වැව්ලි ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම පුළුල් කිරීම සඳහා ද විවිධ පාඨමාලා, විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් හරහා ශිෂ්‍යයන්ගේ නිපුණතාව තියුණු කිරීම හා දැනුම් පදනම වර්ධනය කිරීම සඳහා අප ආයතනය කැප වී ක්‍රියා කරනු ලබයි. මේ සඳහා අවශ්‍ය සහය දැක්වීම සඳහා අපගේ ආදර්ශ පාඨය "විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය" වන අතර වැව්ලිකරුවන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අතර පර්යේෂණ හා පුහුණු කටයුතු වැඩි දියුණු කිරීමට දායක වේ. අපගේ ආයතනය තුළ ඉතා ප්‍රශංසනීය හා වෘත්තීය පරිසරයක් සමග ගුණාත්මක ඉගැන්වීම, ප්‍රකාශන, සම්මන්ත්‍රණ, දේශණ, සම්මේලන ආදිය හරහා වැව්ලි අධ්‍යාපනිකයින් සඳහා සැළකිය යුතු දායකත්වයක් සපයයි.

### මූල්‍ය වර්ෂයේ කැපී පෙනෙන අවස්ථා

වැව්ලි ක්ෂේත්‍රයේ ඉදිරි පිම්මක් සඳහා හැකියාව ඇති වැව්ලිකරුවන්ගෙන් යුත් ශක්තිමත් වැඩපිළිවෙලක් දියත් කිරීම සඳහා ප්‍රාදේශීය වැව්ලි සමාගම්, කුඩා වතු හිමියන්, පර්යේෂණ ආයතන, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ රට වටා සිටින අනෙකුත් පාර්ශව සමඟ අප අඛණ්ඩව කටයුතු කරන්නෙමු. ඒ අනුව අප සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පුහුණුලාභීන් 13558 කට අධික ප්‍රමාණයක් සඳහා ප්‍රතිලාභ දෙමින් වැඩසටහන් 261 කට අධික ප්‍රමාණයක් මෙම මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඇත.

2017 වර්ෂයේ ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ සුවිශේෂ ක්‍රියාකාරකම් අතර, වැව්ලි ක්ෂේත්‍රයට සම්බන්ධ සෑම දිස්ත්‍රික්කයකම 920 කට අධික පිරිසක් සහභාගී වූ අධ්‍යාපන හා වෘත්තීය වැඩසටහන් 33 ක් පැවැත්වීම සඳහන් කළ හැකිය. 2017 වසරේ කුඩා වතු හිමියන්ගේ ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන් 180ක් පැවැත්වීම සඳහා මිලියන 9.00 ක ප්‍රමාණයක් වෙන් කොට තිබූ අතර ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය විසින් වැඩසටහන් 228ක් පැවැත්වීම තුළින් ප්‍රගතියක් වාර්තා කර ඇත. වැව්ලි ක්ෂේත්‍රය ගෝලීය හා ජාතික අස්ථාවරත්වයක තිබියදී ද ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය පුහුණු වැඩසටහන් සඳහා රු.මිලි. 9.62 ක් වෙන් කර ඇති අතර එය ආයතනය විසින් පවත්වනු ලැබූ සියලු පුහුණු ක්‍රියාකරකම් වලින් රු. 15.85 ක මුළු ආදායමක් ලෙස වාර්තා වී ඇත.

## වැව්ලි කර්මාන්තය වෙනුවෙන් අපගේ දායකත්වය

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය විසින් ඉලක්කගත, තීරණාත්මක, නම්‍යශීලි, කාර්යක්‍ෂම, නව්‍ය හා සදාචාරාත්මක කළමනාකරුවන් බිහි කිරීම සඳහා පුහුණු ක්ෂේත්‍රයේ ඇති ඉල්ලුම පිළිබඳ අවබෝධ කර ගෙන ඇත. වැව්ලි කර්මාන්තයේ බහුතරය සඳහා කළමනාකරණය හා තාක්ෂණයට අදාළව පිරිවැය ඵලදායී හා දැරිය හැකි, ගුණාත්මක වෘත්තීය/ අධ්‍යාපනික සේවා සැපයීම සඳහා අප ආයතනය කැප වී සිටී. කාර්මික තිරසාරත්වය, පාරිසරික හා සමාජ සහයෝගීතාවය පවත්වා ගෙන යාම සඳහා කඩිනමින් හා වේගවත්ව ක්‍රියා කිරීමට අප ආයතනය විසින් සිසුන් තුළ මානව වටිනාකම් හා වෘත්තීය ආචාර ධර්ම ප්‍රවර්ධනය කරමු. ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය සත්‍ය වශයෙන්ම කැපවීම, නව්‍ය හා අසමසම අධ්‍යාපනික මෙවලම් උපයෝජනය තුළින් ගැඹුරු දැනුම් පීඨයන් ගොඩනැංවීම තුළින් නවීනතම, වේගවත්, විශේෂිත සහ අවපාත රහිත වෘත්තීය අභිමුඛ කළමනාකරණ පාඨමාලාවන් වැව්ලි ක්ෂේත්‍රය වෙත පිරිනමනු ලබයි.

## අපගේ ජාලගතකරණ ශක්‍යතාව

දිවයින පුරා පිහිටි සියලුම පර්යේෂණ ආයතන, පෞද්ගලික හා රාජ්‍ය ආයතන සමග නවීන තාක්ෂණික දැනුම සහ වැව්ලිකරුවන් සඳහා අදාළ වන කුසලතා ව්‍යාප්ත කිරීම සඳහා ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය සතුව ශක්තිමත් හා ඵලදායි ජාලයක් ඇත. මෙම ඒකක මඟින් තක්සේරු කිරීම හා තාක්ෂණික වැඩි දියුණු කිරීම් සිදු කිරීම, ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ප්‍රාදේශීය වැව්ලි සමාගම් හඳුනා ගැනීමේ ක්ෂේත්‍ර චාරිකා, දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රදර්ශන, කණ්ඩායම් සාකච්ඡා, ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම් සිදු කරනු ලබයි. කාර්මික සංවර්ධනය පිළිබඳ වැව්ලි ප්‍රජාව දැනුවත් කිරීම සඳහා එකී සඳහන් කළ කරුණු අතිශය වැදගත් සාධක වේ.

## ආයතනික තිරසාරත්වය සඳහා නව උපාය මාර්ග සංවර්ධනය

2020 වන විට ක්ෂේත්‍රයට අනුබද්ධිත මානව සම්පතෙහි නිපුණතා හා ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා වැව්ලි කර්මාන්තය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සංවර්ධනය කිරීම සඳහා උපාධි පාඨමාලා 03 ක් ආරම්භ කිරීමට ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය සැලසුම් කරනු ලබයි. පර්යේෂණ හා සංවර්ධන කර්මාන්තයේ තිරසාරත්වය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර අපගේ මීළඟ මධ්‍යකාලීන සැලැස්ම තුළ අප ආයතනය උපාධි පිරිනැමීමේ ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා ප්‍රමුඛතාවක් ලබා දීම තුළින් මෙය යථාර්ථයක් බවට පත් කර ඇත.

2017-2020 උපායමාර්ගික අරමුණු මඟින් ආයතනයක් වශයෙන් අප මීළඟ වසර 04 තුළ අත්පත් කර ගත යුතු දෑ පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත.

එම අරමුණු නම් :-

උපායමාර්ගික අරමුණු 01 :- ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක සේවාවක් සැපයීමට අප ආයතනය ශක්තිමත් කිරීම හා ආයතනයේ මානව සම්පත සංවර්ධනය කිරීම හා පුහුණු අංශය ශක්තිමත් කිරීම.

උපායමාර්ගික අරමුණු 02 :- අලෙවිකරණය හා ප්‍රවර්ධනය ශක්තිමත් කිරීම තුළින් අධ්‍යාපනික විසඳුම් සමග පුළුල් කීර්තිනාමයක් අත්පත් කර ගැනීම.

උපායමාර්ගික අරමුණු 03 :- යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා මනා තත්ත්ව කළමනාකරණ පද්ධතියක් සහිත ආකර්ශණීය පරිසරයක් ඇති කිරීම.

අප ආයතනික වශයෙන් සංවර්ධනය වෙමින් පවතින බැවින් නව මාර්ගයන්, නව්‍යකරණය හා දායකත්වය වැඩි දියුණු කිරීම, කාර්යයන් සිදු කිරීම සඳහා පුද්ගලයන් බල ගන්වන, අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙන, නවෝත්පාදනයන් සිදු කරන, ආයතනය දක්වන දායකත්වය පිළිබඳ ස්වයං ඇගයීමක් සිදු කරනු ලබන උද්‍යෝගීමත් පරිසරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය වේ. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන්ගේ හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුග්‍රහය හා මඟ පෙන්වීම යටතේ දියුණුව කරා ළඟා වීමට අප ආයතනයට හැකියාවක් ලැබී ඇත. එමෙන්ම මෙම වසර සාර්ථක වසරක් බවට පත් කර ගැනීමට උපරිම සහයෝගයක් ලබා දුන් ආයතනයේ සභාපතිතුමාටත් ජාතික වැවිලි කළමනාකරණ ආයතන පවුලේ සාමාජිකයන්ටත් මාගේ විශේෂ ස්තූතිය පිරිනමමි.



**ආචාර්ය ප්‍රසාද් ධර්මසේන**
**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**
27.03.2018

# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

## සංස්ථාපනික වාර්තාව සහ පරමාර්ථ



ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 අංක 45 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කර ඇති අතර වඩාත් ඵලදායී හා ශක්තිමත් රාජ්‍ය ව්‍යස්ථාපිත ආයතනයක් ඇති කිරීම උදෙසා 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 දරණ පනත් මගින් සංශෝධනයට ලක් කර ඇත. ආයතනයේ ප්‍රධාන කාර්යාලය එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය යන ලිපිනයේ ස්ථාපිතව පවත්වා ගෙන යනු ලැබේ.

මෙම පනත් වලට අනුව, පුහුණු වැඩසටහන්/අධ්‍යයන පාඨමාලා සාර්ථකව නිම කරන අයට සහතික පත්‍ර නිකුත් කිරීමට සහ වතු විධායක නිලධාරීන් සඳහා වෘත්තීය සාමාජිකත්වය ප්‍රධාන කාණ්ඩ 03 ක් යටතේ පිරිනැමීම සඳහා ස්ථාපිත රජයේ එකම ආයතනය ලෙස ජාතික වැවිලි කළමනාකරණ ආයතනය බල ගන්වා ඇත. කුඩා වතු හිමියන් ද ඇතුළුව වැවිලි ක්ෂේත්‍රයේ රැකියා නියුක්තිකයන්ගේ වෘත්තීය හැකියාවන් ඉහළ නිපුණතාවයෙන් යුතුව පවත්වා ගෙන යාම මේ මගින් සහතික වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධාකාරයේ සම්මන්ත්‍රණ, වැඩමුළු, විභාග පැවැත්වීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා පර්යේෂණ හා උපදේශන සේවා සැපයීම සිදු කරයි. එමෙන්ම විදේශ සිසුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමේ හැකියාවද ආයතනය සතුව ඇත.

### 01. පරමාර්ථ

අ) වැවිලි සේවයෙහි නියුක්ත සියලු වර්ග වලට අයත් සේවා නියුක්තයන්ට ආයතනය විසින්ම හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඇති වෙනත් ආයතන සම්බන්ධව වැවිලි කළමනාකරණයට අදාල පුහුණු වීමේ පහසුකම් සහ පුහුණු වීමේ වැඩසටහන් සැපයීම.

ආ) සේවයෙහි යෙදී සිටින සේවා නියුක්තයන්ට වැවිලි කළමනාකරණය පිළිබඳ සංස්කරණ සම්මේලන සහ තත්වානුකූලකරණ පාඨමාලා සංවිධානය කිරීම

ඇ) රාජ්‍ය අංශයෙහි මෙන් ම පෞද්ගලික අංශයෙහි වැවිලි සේවයේ නියුතු සේවක පිරිස් සඳහා වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව සැලසීම

ඈ) තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය , පොල් පර්යේෂණ ආයතනය සහ එබඳු වෙනත් ආයතනයන් හා සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලා සංවිධානය කිරීම සහ යෝග්‍ය අවස්ථාවල දී ඩිප්ලෝමා ප්‍රදානය කිරීම

ඉ) වැවිලි කළමනාකරණය හා සංවර්ධනය සම්බන්ධ වු සම්මන්ත්‍රණ හා කාර්ය සැසි සංවිධානය කිරීම හා පැවැත්වීම සහ සගරා සහ කලාප පළ කිරීම.

ඊ) වෙනත් සමාන ආයතන වලින් දැනටමත් විධි විධාන සලස්වා නොමැති, වැවිලි කළමනාකරණය සහ කම්කරු සබඳතා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

උ) වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය දක්ෂතාවය ඇති තැනැත්තන්ට වැවිලි කර්මාන්තයේ මිනිස් බල අවශ්‍යතාවයන් ගැන සැලකිලිමත්ව වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුව ලබා දීම.

ඒ) වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර යම් වෙනත් ආයතනයකට කළමනාකාරීත්ව, තාක්ෂණික සහ පරිපාලන උපදෙස් සහ සේවා සැපයීම.

## පාලක මණ්ඩලයේ වාර්තාව

සමාලෝචිත වර්ෂයේ දී ආයතනයේ පාලක මණ්ඩලයේ රැස්වීම් 11 ක් අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතන පරිශ්‍රයේ දී පවත්වන ලදී. මෙම පාලක මණ්ඩල රැස්වීම් අතරතුර පහත සඳහන් ප්‍රධාන කරුණු හා ක්‍රියාකාරකම් සමාලෝචනයට භාජනය කර ඒ සඳහා සුදුසු පරිදි අනුමැතීන් ලබා දී ඇත.

- ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් ඉහලම අනුකූලතාවයකින් යුතුව ඉටු කළ බවට සහතික කිරීම
- පුහුණු අංශයේ සියලුම මෙහෙයුම් හා ක්‍රියාකාරකම් හි පාරදෘශ්‍යභාවය හෙළිදරව් වන ආකාරයට කටයුතු කළ බව සහතික කිරිම.
- ආයතනයේ සියලුම පාර්ශ්වකරුවන් වෙත අපේක්ෂිත ප්‍රතිඵල ලබා දිම සඳහා ආයතන සතු සම්පත් ඉහළ ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව මෙහයවීම.
- ආයතනයේ මධ්‍ය හා දිගු කාලීන උපාය මාර්ග,වාර්ෂික අයවැය,ක්‍රියාකාරි සැලසුම,සැලකිය යුතු මූල්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක කිරිම සඳහා මඟ පෙන්වීම හා අනුමැතිය ලබා දීම

1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ 06 වන වගන්තිය සහ 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 දරණ සංශෝධිත පනත් වල විධි විධාන වලට අනුව 2017 වර්ෂයේ පාලක මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

| නම | තත්ත්වය | නම | තත්ත්වය |
|---|---|---|---|
| දීප්ති අබේවික්‍රම මහතා<br>සභාපති<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | සභාපති | මලීන් ගුණතිලක මහතා<br>ලේකම්<br>ලංකා වැවිලිකරුවන්ගේ සංගමය | සාමාජික |
| ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා<br>අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | සාමාජික | ඉන්දික ප්‍රේමරත්න මහතා<br>අධ්‍යක්ෂ<br>මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | සාමාජික |
| ආචාර්ය ඩබ්. එම්. පී. සෙනෙවිරත්න මහතා<br>අධ්‍යක්ෂ<br>රබර් පර්යේෂණ ආයතනය | සාමාජික | ජී. ආර්. ටයිටස් සුනිල් සිල්වා මහතා<br>සභාපති<br>තුරුසවිය අරමුදල | සාමාජික |
| ආචාර්ය අයි. එස්. බී. අබේසිංහ මහතා<br>අධ්‍යක්ෂ<br>තේ පර්යේෂණ ආයතනය | සාමාජික | එම්. එම්. ඩී. තිලකරත්න මහතා<br>නියෝජිත<br>වෘත්තීය සමිති | සාමාජික |
| ආචාර්ය එල්. සී. පී. ප්‍රනාන්දු මිය<br>අධ්‍යක්ෂ<br>පොල් පර්යේෂණ ආයතනය | සාමාජික | එන්. එම්. ආර්. ජයතිලක මහතා<br>නියෝජිත<br>සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය | සාමාජික |
| කේ.එන්. කුමාරි සෝමරත්න මෙනවිය<br>අතිරේක ලේකම් (පාලන)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික | චන්දන ජයසේකර මහතා<br>නියෝජිත<br>තේ කර්මාන්ත ශාලා නිලධාරීන්ගේ සංගමය | සාමාජික |
| ඩී. පී. මහීපාල මහතා<br>සාමාන්‍යාධිකාරි<br>කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | සාමාජික | අර්ජුන් දැරණියගල මහතා<br>නියෝජිත<br>පොල් වැවිලි කරුවන්ගේ සංගමය | සාමාජික |
| කුමාර වීරසූරිය මහතා<br>නියෝජිත<br>වෘත්තීය සමිති | සාමාජික | | |

- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) කේ.එන්. කුමාරි සෝමරත්න මෙනවිය ස්ථාන මාරු ලබා ගැනීම නිසා 2017 අගෝස්තු මස සිට බල පැවැත්වෙන පරිදි සාමාජිකත්වයෙන් ඉවත් විය.

- තේ කර්මාන්ත ශාලා නිලධාරීන්ගේ සංගමය නියෝජනය කළ චන්දන ජයසේකර මහතා වෙනුවට 2017 නොවැම්බර් මස සිට ඉසුරු ඉෂාන් මහතා පත් කරන ලදි.

## විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුකූලව පිහිටුවා ඇති අතර, පහත සඳහන් කරුණු විමර්ශණය සඳහා එම කමිටුව වෙත නිසි අධිකාරී බලය ආයතනයේ පාලක මණ්ඩලය මගින් පිරිනමා ඇත.

- ආයතනයේ මූල්‍ය වාර්තා
- අභ්‍යන්තර පාලනය සහතික කිරීම.
- විගණන විමසුම් හා විගණන වාර්තා වලට අදාළ කරුණු හා ආයතනය විසින් සකස් කරන ලද පිළිතුරු නිර්දේශ කිරීම.
- ප්‍රාග්ධන භාවිතය, පුනරාවර්තන වියදම් සහ ප්‍රසම්පාදන කමිටු තීරණ සමාලෝචනය කිරීම.
- අයවැය ඇස්තමේන්තු සහ සත්‍ය කාර්ය සාධනයේ සාර්ථකත්වය.
- අතිකාල දීමනා, ඉන්ධන භාවිතය, දුරකථන ගාස්තු සහ විදුලිය වියදම් අධීක්ෂණය කිරීම.
- පුහුණු කිරීමේ වැඩසටහන් හා ඒවායේ ක්‍රියාකාරකම් වලට අදාළ ආදායම හා වියදම් පරීක්ෂා කිරීම.
- ආයතනයේ අනෙකුත් මූල්‍ය ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම.

2017 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇති අතර, එම රැස්වීම් ජනවාරි 11, ජූනි 03, ඔක්තෝබර් 25 සහ දෙසැම්බර් 28 යන දිනයන්හි දී පවත්වා ඇත.

**අභ්‍යන්තර විගණනය**

ආයතනයේ පුරප්පාඩු ව පැවති අභ්‍යන්තර විගණක තනතුර සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ දී සම්පූර්ණ කරන ලදි. ඒ අනුව ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු එම නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සිදු විය.

**විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය**

| නම | තත්ත්වය | නම | ස්වරූපය |
|---|---|---|---|
| ඉන්දික ප්‍රේමරත්න මහතා<br>අධ්‍යක්ෂ<br>විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | සභාපති | කේ.එච්.යූ.පී.විජේවීර මහතා<br>අභ්‍යන්තර විගණක<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | ලේකම්<br>විගණන හා කළමනාකරණ කමිටුව |
| ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා<br>අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | සාමාජික | එල්. ඩී. ජේ. ප්‍රියන්ත මහතා<br>ගණකාධිකරි<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | ආයතනයේ නියෝජිත |
| කේ. එන්. කුමාරි සෝමරත්න මෙනෙවිය<br>අතිරේක ලේකම් (පාලන)<br>වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික | නිශාමිණි ඉලංගන්තිලක මිය<br>පුහුණු අංශ ප්‍රධානී<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | ආයතනයේ නියෝජිත |
| ආචාර්ය එල්. සී.පී. ප්‍රනාන්දු මිය<br>අධ්‍යක්ෂ<br>පොල් පර්යේෂණ ආයතනය | සාමාජික | සී.ඩී. මාගින ආරච්චි මෙනවිය<br>සහකාර අධ්‍යක්ෂ<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | ලේකම්<br>විගණන හා කළමනාකරණ කමිටුව |

විගණන හා කළමනාකරණ කමිටුව ඉහත සඳහන් ක්‍රියාකාරී සහ ක්‍රියාකාරී නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිත ඉන්දික ප්‍රේමරත්න මහතා එහි සභාපතීත්වය හොබවන ලදී.

- වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් කේ.එන්. කුමාරි සෝමරත්න මෙනවිය ස්ථාන මාරු ලබා ගැනීම නිසා 2017 අගෝස්තු මස සිට බල පැවැත්වෙන පරිදි සාමාජිකත්වයෙන් ඉවත් විය.

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සහකාර අධ්‍යක්ෂව සිටි සී. ඩී. මාගින ආරච්චි මෙනවිය 2017.10.20 දින සේවයෙන් ඉවත් වී ඇත.

## ආයතනීය කාර්ය මණ්ඩලය

**කළමනාකාරීත්වය**

අධ්‍යක්ෂ, ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරිවරයා වන අතර, ඔහු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. 2017 වර්ෂය අවසාන වන විට ස්ථිර කාර්ය මණ්ඩලය 59 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය ප්‍රධාන ශ්‍රීතයන් තුනකින් සමන්විත වේ.එනම් පුහුණු අංශය, පරිපාලන අංශය හා ගිණුම් අංශය වේ.



දීප්ති අබේවික්‍රම මහතා
සභාපති



ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි

## විධායක ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය

මධ්‍යම කළමනාකරණ ශ්‍රේණිය නියෝජනය කරන කාර්යමණ්ඩලය සහ ඔවුන්ගේ තනතුරු පහත සඳහන් කර ඇත.



එස්. එන්. ඉලංගන්තිලක මිය
පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික) , පුහුණු අංශ ප්‍රධානී



එල්. ඩී. ජේ ප්‍රියන්ත මහතා
ගණකාධිකාරි,
මූල්‍ය අංශ ප්‍රධානී



සී. ඩී. මාගින ආරච්චි මෙනවිය
සහකාර අධ්‍යක්ෂ (පාලන), පරිපාලන අංශ ප්‍රධානි
(2017.10.20 දින සේවයෙන් ඉවත් විය)



පී. එච්. ජයතිලක මහතා
පුහුණු කිරීමේ විශේෂඥ
(ගිණුම් හා මුල්‍ය කළමනාකරණ)
පුහුණු අංශය



ආර්. එන් ලොකුහෙට්ටි මිය
පුහුණු කිරීමේ විශේෂඥ
(කළමනාකරණ)
පුහුණු අංශය

<u>**කණිෂ්ඨ විධායක ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය**</u>



සී. ඩී. පතිනායක මහතා
පුහුණු කිරීමේ නිලධාරි
(කෘෂි ආර්ථික)



එම්.එල්.ආර්. ජයන්ත මහතා
පරිපාලන නිලධාරි



කේ.එච්.යූ.පී. විජේවීර මහතා
අභ්‍යන්තර විගණක



එන්. ඩී. එස්. බී.
තෙන්නකෝන් මහතා
නේවාසිකාගාර කළමනාකරු
අතුරුගිරිය



එම්.බී.එම්.ඒ.එල්. බණ්ඩාරනායක මහතා
නේවාසිකාගාර කළමනාකරු
බගවන්තලාව



පී.ඩබ්.ජී.එන්.සී. වීරකෝන් මහතා
පුහුණු කිරීමේ නිලධාරි
(කළමනාකරණ)



එල්.එස්. ලියනගේ මහතා
පුහුණු කිරීමේ නිලධාරි
(ගිණුම් හා මූල්‍ය
කළමනාකරණ)



ඉන්ද්‍රානි ජයසූරිය මහත්මිය

වැඩසටහන් නිලධාරි



කේ. ජී. නේපාල මහතා
මාණ්ඩලික සහකාර (පුහුණු)

## 2017.12.31 දිනට කාර්ය මණ්ඩලය

### පුහුණු කිරීමේ අංශය (මුළු කාර්ය මණ්ඩලය 18)

| | |
|---|---|
| අධ්‍යක්ෂ | 1 |
| පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික) | 1 |
| පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ) | 1 |
| පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) | 1 |
| පුහුණු කිරීමේ නිලධාරී (කෘෂි ආර්ථික) | 1 |
| පුහුණු කිරීමේ නිලධාරී (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) | 1 |
| පුහුණු කිරීමේ නිලධාරී (කළමනාකරණ) | 1 |
| වැඩසටහන් නිලධාරි | 1 |
| මාණ්ඩලික සහකාර (පුහුණු) | 1 |
| පුස්තකාලයාධිපති | - |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර | 1 |
| කළමනාකරණ සහකාර | 7 |
| කාර්යාල කාර්ය සහායක | 1 |
| කම්කරු | 1 |

### පරිපාලන අංශය (මුළු කාර්ය මණ්ඩලය 31)

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | 1 |
| පරිපාලන නිලධාරි | 1 |
| නේවාසිකාගාර කළමනාකරු | 2 |
| ප්‍රසම්පාදන සහකාර | 1 |
| කළමනාකරණ සහකාර | 8 |
| රියදුරු | 7 |
| උද්‍යාන සහායක | 3 |
| කාර්යාල කාර්ය සහායක | 3 |
| නේවාසිකාගාර සහායක | 3 |
| මුද්‍රණ සහකාර | 1 |
| කම්කරු | 1 |

**මූල්‍ය අංශය (මුළු කාර්ය මණ්ඩලය 09)**

| | |
|---|---|
| ගණකාධිකාරී | 1 |
| ගිණුම් සහකාර | 1 |
| කළමනාකරණ සහකාර | 6 |
| කාර්යාල කාර්ය සහායක | 1 |

**අභ්‍යන්තර විගණන අංශය (01)**

| | |
|---|---|
| අභ්‍යන්තර විගණක | 1 |

සංවිධාන ව්‍යුහය පහත සඳහන් වේ.

## ආයතනයේ පරිපාලන අංශය පිළිබඳ සමාලෝචනය

පරිපාලන අංශයේ ප්‍රධානී සහකාර අධ්‍යක්ෂ වන අතර ආයතනයේ සාමාන්‍ය පරිපාලන කටයුතු වල වගකීම මෙම නිලධාරියා විසින් දරයි. කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, සේවක උසස් වීම්, මානව සම්පත් සංවර්ධනය, සේවක ගැටළු ආදී සියළු කටයුතු පරිපාලන අංශය විසින් මෙහෙයවයි.. ආයතනයේ ගොඩනැගිලි අළුත්වැඩියා හා වැඩි දියුණු කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය සියළුම අයිතමයන් ප්‍රසම්පාදන කටයුතු කරනු ලබන්නේ පරිපාලන අංශය විසිනි. 2017 වර්ෂය තුළ අනුමත කාර්ය මණ්ඩල පරිපාටිය අනුව පුරප්පාඩු වූ තනතුරු බඳවා ගැනීම සඳහා දැන්වීම් පල කරන ලදී.

අප ආයතනය විසින් අතුරුගිරිය හා බොගවන්තලාව මධ්‍යස්ථානයන්හි නවාතැන් පහසුකම් අවශ්‍ය වන බාහිර ආයතන සඳහා නවාතැන් පහසුකම සැපයීමේ කටයුතු ද සිදු කරනු ලබයි. ආයතනයේ පවත්නා සේවාවන් හි ගුණාත්මකභාවය ඉතා උසස් අන්දමින් වැඩි දියුණු කිරීමට කටයුතු යොදා ඇති අතර එමගින් ආයතන උපයනු ලබන කුලී ආදායම ඉහල නැංවීම අපේක්ෂා කරයි.

## සේවක ප්‍රතිලාභ

සේවකයන්ගේ වෘත්තීය වර්ධනය සඳහා ආයතනික කළමනාකාරීත්වය විසින් සේවකයන්ගේ කුසලතා, දැනුම වැඩි දියුණු කිරීම සහ සේවක ඉල්ලීම් පරිදි දේශීය හා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම සිදු කරනු ලබයි. 2016 වසරට පෙර පැවැති ආයතනික සුභ සාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 2017 වසරේ දී තව දුරටත් අඛණ්ඩව පවත්වා ගෙන ගියේ ය.


සභාපති සහ පාලක මණ්ඩලය
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම (HM 1-2)
පුහුණු අංශය
පාලන අංශය
මූල්‍ය අංශය
අභ්‍යන්තර විගණන
කෘෂි විද්‍යා
කළමනාකරණ
කළමනාකරණ මට්ටම (HM 1-1)
පුහුණු කිරීමේ විශේෂඥ( කෘෂි ආර්ථික)
පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)
පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ)
QMR*
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ගණකාධිකාරී
කණිෂ්ඨ කළමනාකරු (JM 1-1)
පුහුණු කිරීමේ නිළධාරි(කෘෂි ආර්ථික)
වැඩසටහන් නිළධාරි (විභාග)
පුස්තකාලයාධිපති
පුහුණු කිරීමේ නිළධාරි (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)
පුහුණු කිරීමේ නිළධාරි (කළමනාකරණ)
පරිපාලන නිළධාරි
නේවාසිකාගාර කළමනාකරු අතුරුගිරිය
නේවාසිකාගාර කළමනාකරු බගවන්තලාව
අභ්‍යන්තර විගණක
ආශ්‍රිත නිළධාරී (MA 3)
මාණ්ඩලික සහකාර (පුහුණු)
ප්‍රසම්පාදන සහකාර
ගිණුම් සහකාර
කළමනාකරණ සහකාර (තාක්ෂණික) (MA 2-1)
ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන (MA 1-1)
කළමනාකරණ සහකාර (10)
කළමනාකරණ සහකාර (06)
කළමනාකරණ සහකාර (06)
රියදුරු -7
ප්‍රාථමික මට්ටම ( පුහුණු) (PL-3)
ප්‍රාථමික මට්ටම ( නුපුහුණු) (PL-1)
කාර්යාල කාර්ය සහායක - 5
මුද්‍රණ සහායක - 1
උද්‍යාන සහායක - 3
සනීපාරක්ෂක කම්කරු - 2
නේවාසිකාගාර සහායක - 3

## ආයතනයේ මූලික ක්‍රියාකාරකම්

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සාර්ථකව පාඨමාලා හැදෑරූ අයට සහතික පිරිනැමීම සහ සුදුසුකම්ලත් වැවිලි විධායකයින් හට වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීමට බලය ලත් එකම රාජ්‍ය ආයතනයයි. තේ, රබර්, පොල්, උක්, කජු, කුරුඳු සහ තල් භෝග ආශ්‍රිත කුඩා වතු හිමියන් ඇතුළු වැවිලි කර්මාන්තයේ නියුතු අයගේ වෘත්තීය නිපුණතාවය පවත්වා ගැනීම මෙම ආයතනයේ වගකීමකි. ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ආයතනයේ මූලික ක්‍රියාකාරකම් පහත පරිදි ප්‍රධාන කාණ්ඩ 7 ක් යටතේ දැක්විය හැක.

### අ) අධ්‍යාපනික වැඩසටහන්

පාඨමාලා සඳහා සහභාගී වන්නන්ගේ අධ්‍යාපනික සුදුසුකම් හා නිපුණතාවන් වැඩි දියුණු කිරීමේ අරමුණින් අධ්‍යාපනික පාඨමාලා සැලසුම් කර ඇත.මෙම පාඨමාලා සඳහා සහතිකපත් පිරිනැමීම සඳහා, පාඨමාලා වලට සහභාගී වන්නන්ගෙන් තෘප්තිමත් විය හැකි ආකාරයේ අධ්‍යාපන වාර්තාවක් පවත්වාගෙන යාම හා ඔවුන් ලියාපදිංචි වී ඇති පාඨමාලා මොඩියුල වල සඳහන් කර ඇති වගකීම් ඉටු කිරීම අවශ්‍යය වේ. අධ්‍යාපනික වැඩසටහන් වල පහත සඳහන් පාඨමාලාවන් ඇතුලත් වේ.




- BSc වැවිලි කළමනාකරණ උපාධිය. (වයඹ විශ්ව විද්‍යාලය සමඟ එක්ව)
- ජාතික වැවිලි කළමනාකරණ ඩිප්ලෝමාව.
- වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව.
- වැවිලි ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.
- පොත් තැබීම හා වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව.
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ මූලික පාඨමාලාව.
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව.

  (IPM ආයතනය සමග ඒකාබද්ධව)
- තේ නිෂ්පාදනය සහ තේ කර්මාන්තශාලා කළමනාකරණය පිළිබඳ ජාතික සහතිකපත්‍ර විභාගය.
- වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
- ප්‍රජා බලගැන්වීම සහ ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලා (අදියර 3 - 6)

## ආ) වෘත්තීය වැඩසටහන්

වෘත්තීය පාඨමාලා පැවැත්වීමෙහි ප්‍රධාන අරමුණ වනුයේ වතු අධ්‍යාපනයෙහි විවිධ පැතිකඩයන් පිළිබඳ න්‍යායාත්මක / ප්‍රායෝගික දැනුම සහ කුසලතා ලබා දීමයි. වැඩසටහන් සඳහා සහභාගී වන්නන්ගේ වෘත්තීය අපේක්ෂාවන් තක්සේරු කිරීම හා වැඩි දියුණු කිරීම සඳහාත් ආයතනය සඳහා ඔවුන්ගේ වටිනාකම් වැඩි දියුණු කිරීම සඳහාත් මෙම පාඨමාලාවන් සැලසුම් කර ඇත.



ආයතනය විසින් පවත්වනු ලබන වෘත්තීය වැඩසටහන් පහත පරිදි වේ.

- තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- රබර් නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- භාෂා ප්‍රවීණතා විභාගය

## (ඇ) නිපුණතා සංවර්ධන වැඩසටහන්

මෙම ප්‍රභේදය යටතේ ඇති වැඩසටහන් විශේෂයෙන්ම නිර්මාණය කර ඇත්තේ විශේෂිත රැකියා සඳහා සෘජුවම අදාල වන කුසලතා හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහාය.වැඩසටහන් සඳහා සහභාගීවන්නන්ව රැකියා විස්තරයට අදාලව නවීන තාක්ෂණය හා වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයන් සමඟ සමීප කර වීම මේ තුලින් අපේක්ෂා කරනු ලබයි.





ආයතනය විසින් පහත සඳහන් නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.



- වැඩමුළු , සම්මන්ත්‍රණ හා සම්මේලන
- තාක්ෂණික සංවර්ධන වැඩසටහන්
- කුසලතා සංවර්ධන වැඩසටහන්
- කම්කරු සංවර්ධන වැඩසටහන්
- කළමනාකරණ සංවර්ධන වැඩසටහන්
- කුඩා වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන්

ඈ) වැවිලි කලමනාකරණයට අදාලව ප්‍රකාශන නිකුත් කිරීම. (වැවිලි කළමනාකරණය සම්බන්ධ සඟරා , පුවත් පත්‍රිකා, ශිෂ්‍ය අත්පොත හා අනෙකුත් වාර සඟරා)

ඉ) වැවිලි කළමනාකරණය පිළිබඳ පර්යේෂණ හා උපදේශන සේවා සැපයීම හා රාජ්‍ය/පෞද්ගලික අංශයේ සංවිධාන සඳහා සේවකයන් බඳවා ගැනීමට හා ප්‍රවර්ධනය කිරීමට අදාල පරීක්ෂණ හා විභාග. (වාචික සහ ලිඛිත)

ඊ) සුදුසුකම් ලබන වතු විධායකයින්ට වෘත්තීය සාමාජිකත්ව ප්‍රධානය කිරීම. (ගරු සාමාජිකත්ව , හවුල් සාමාජිකත්ව, ආශ්‍රිත සාමාජිකත්ව හා ශිෂ්‍ය සාමාජිකත්ව)

උ) පුහුණු වැඩසටහන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා බාහිර ආයතන සඳහා ආයතනයේ පහසුකම් (ආහාර පාන , නවාතැන් සහ දේශන ශාලා) සැපයීම.

## පුහුණු වැඩසටහන් වල ප්‍රගති සමාලෝචනය

ආයතනය විසින් මූලිකවම ප්‍රධාන කොටස් 2 ක් යටතේ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. එනම් වැවිලි සමාගම් සඳහා **ආදායම් උත්පාදන වැඩසටහන්** සහ රාජ්‍ය අරමුදල් භාවිතයෙන් කුඩා වතු අංශ සඳහා නොමිලේ පවත්වනු ලබන **ධාරිතා වර්ධන වැඩසටහන්ය**.

## ආදායම් උත්පාදන වැඩසටහන්

ආයතනයට ආදායම් උත්පාදනය කිරීම සඳහා ආයතනය විසින් 2017 වසරේදී පහත දැක්වෙන අධ්‍යාපනික හා වෘත්තීය වැඩසටහන් පවත්වා ඇත.

## ආදායම් උපයන වැඩ සටහන් විස්තර 2017

| අංකය | වැඩ සටහන | පැවැත්වූ වැඩ සටහන් ගණන | එක්වක් වැඩ සටහනට ගත වූ කාලය | සහභාගීවූ ගණන |
|---|---|---|---|---|
| 01 | වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 01 | මාස 18 | 16 |
| 02 | තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය පිළිබඳ වෘත්තීය වැඩසටහන | 01 | දින 09 | 19 |
| 03 | රබර් නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය පිළිබඳ වෘත්තීය වැඩසටහන | 01 | දින 07 | 09 |
| 04 | වැවිලි ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | මාස 14 | 13 |
| 05 | පොත් තැබීම හා වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | මාස 12 | 20 |
| 06 | භාෂා ප්‍රවීනතා විභාගය | 01 | දින 02 | 28 |
| 07 | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ මූලික පාඨමාලාව. | 01 | මාස 04 | 21 |
| 08 | ප්‍රජා බලගැන්වීම සහ ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව. | 01 | දින 10 | 13 |
| 09 | වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව- සිංහල මාධ්‍ය | 01 | මාස 06 | 12 |
| 10 | වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව- ඉංග්‍රීසි මාධ්‍ය | 01 | මාස 06 | 11 |
| 11 | තේ රස බැලීම සහ වර්ගීකරණය | 01 | දින 03 | 34 |
| 12 | සතුටින් වැඩකිරීමේ කලාව | 04 | දින 01 | 188 |
| 13 | සඵල සන්නිවේදනය | 03 | දින 01 | 102 |
| 14 | වෙනස්වීම් කලමනාකරණය තුලින් ඵලදායීතාවය වර්ධනය | 01 | දින 02 | 21 |
| 15 | ඵලදායීතා සහ තත්ව කළමනාකරණ ශිල්ප ක්‍රම | 02 | දින 01 | 45 |

| | | | | |
|---|---|---|---|---|
| 16 | නායකත්ව කුසලතා වර්ධනය | 02 | දින 01 | 116 |
| 17 | තේ කර්මාන්තශාලා නිළධාරීන්ගේ කුසලතා වර්ධනය | 01 | දින 05 | 22 |
| 18 | විශේෂ වැඩසටහන් | 09 | දින 01 | 230 |
| | **එකතුව** | **33** | | **920** |

**(වගුව 1)**

මීට අමතරව පෙර වසරේදී ආරම්භ කරන ලද ඇතැම් අධ්‍යයන පාඨමාලාවන් සහ විභාගයන් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. ඒවා පහත සඳහන් පරිදි වේ.

**2016 වසරේ සිට අඛණ්ඩව පවත්වනු ලබන වැඩ සටහන්**

| අංකය | වැඩසටහන | පැවැත් වූ වැඩසටහන් ගණන | එක්එක් වැඩසටහනට ගත වූ කාලය | සහභාගීවූ ගණන |
|---|---|---|---|---|
| 01 | වැවිලි කළමනාකරණය පිළිබඳ B.Sc. උපාධිය | 01 | අවුරුදු 03 | |
| 02 | වැවිලි ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | මාස 14 | 11 |
| 03 | පොත් තැබීම සහ වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | මාස 12 | 10 |
| | එකතුව | 03 | | 21 |

**(වගුව 2)**

**ආදායම් උත්පාදන පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය - 2017**

ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්ම තුලින් අපේක්ෂිත ආදායම් උත්පාදන වැඩසටහන් 48 න්, වැඩසටහන් 33 ක් පවත්වා ඇත. 2017 වසරේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාවේ ප්‍රගතිය 69% ලෙස වාර්තා වී ඇත. වසර අවසානයේදී ආයතනය විසින් අපේක්ෂිත පුහුණු ආදායමට සමගාමීව 64% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත. 2017 වසර සඳහා සැලසුම් කළ වතු කාර්ය මණ්ඩල පුහුණු වන්නන් 920 න් 917 ක් එනම් 100% ක්ම ඉලක්කය සපුරා ගැනීමට හැකි විය.

පහත දැක්වෙන වගුව (අංක 3) තුළින් 2017 වසරේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය නිරූපනය කරනු ලබයි.

## පුහුණු වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුව | | | සත්‍ය | | | ප්‍රගතිය (ප්‍රතිශත) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන් ගණන | සිසුන් ගණන | ආදායම (රු.මිලි) | වැඩසටහන් ගණන | සිසුන් ගණන | ආදායම (රු.මිලි) | වැඩසටහන් ගණන | සිසුන් ගණන | ආදායම |
| අධ්‍යාපනික හා වෘත්තීය වැඩසටහන් | 10 | 160 | 5.92 | 8 | 139 | 2.603 | 80% | 87% | 44% |
| නිපුණතා සංවර්ධන වැඩසටහන් | 5 | 75 | 1.35 | 1 | 22 | 0.540 | 20% | 29% | 40% |
| තාක්ෂණික සංවර්ධන වැඩසටහන් | 2 | 30 | 0.63 | 1 | 34 | 0.408 | 50% | 113% | 65% |
| විශේෂ පුහුණු වැඩසටහන් | 21 | 460 | 8.75 | 9 | 230 | 2.675 | 43% | 50% | 31% |
| කළමනාකරණ සංවර්ධන වැඩසටහන් | 7 | 140 | 0.63 | 12 | 472 | 2.865 | 171% | 337% | 455% |
| වැව්ලි කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලා | 2 | 32 | 5.4 | 2 | 23 | 4.987 | 100% | 72% | 92% |
| කම්කරු සංවර්ධන වැඩසටහන් | 1 | 20 | 0.03 | 0 | 0 | 0 | 0% | 0% | 0% |
| එකතුව | 48 | 917 | 22.71 | 33 | 920 | 14.081 | 69% | 100% | 62% |
| බාහිර විභාග වලින් උපයන ආදායම | | | 2.00 | | - | 1.769 | - | | 89% |
| එකතුව | **48** | **917** | **24.71** | **33** | **920** | **15.85** | **69%** | **100%** | **64%** |

(වගුව 3)




(ප්‍රස්තාර 01)




(ප්‍රස්තාර 02)

## ආදායම් උත්පාදන වැඩසටහන් වල ලාභ අලාභ විශ්ලේෂණය

ජාතික අයවැය වෙත බර පැටවීමකින් තොරව, නාමික ලාභාන්තය සමඟ වියදම පියවා ගනිමින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමට, ආයතනය විසින් විශේෂයෙන්ම වැවිලි අංශය සඳහා ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. 2017 වසර තුලදී පුහුණු ක්‍රියාකාරකම් වලින් මුළු පුහුණු ආදායම වන රු.මිලි 15.853 න් 56% සාමාන්‍ය ලාභාන්තිකයක් සහිතව රු.මිලි 8.942 ක ශුද්ධ ආදායමක් වාර්තා කර ඇත. පෙර වර්ෂයේ සංඛ්‍යා ලේඛණ අනුව මුළු පුහුණු ආදායම වන රු.මිලි 12.787 න් රු.මිලි 6.553 ක ශුද්ධ ආදායමක් පෙන්වන ලදී. පසුගිය වසරට සාපේක්ෂකව ශුද්ධ ආදායම රු.මිලි 2.389 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

| වැඩසටහන් කාණ්ඩය | ආදායම රු.මිලි | පිරිවැය රු.මිලි | ලාභ/අලාභ | ලාභ ආන්තිකය |
|---|---|---|---|---|
| අධ්‍යාපනික හා වෘත්තීය | 2.603 | 1.702 | 0.901 | 35% |
| කලමනාකරණ සහ තාක්ෂණික සංවර්ධනය | 3.273 | 1.790 | 1.483 | 45% |
| කුසලතා සංවර්ධනය | 0.540 | 0.110 | 0.430 | 80% |
| වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලා | 4.987 | 1.334 | 3.653 | 73% |
| විශේෂ පුහුණු | 2.681 | 0.675 | 2.006 | 75% |
| බාහිර විභාග වලින් උපයන ආදායම | 1.769 | 1.300 | 0.469 | 27% |
| එකතුව | 15.853 | 6.911 | 8.942 | 56% |

**(වගුව 4)**

## කුඩා වතු හිමියන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් - 2017

ආයතනය විසින් වැවිලි ක්ෂේත්‍රයේ කුඩා වතු හිමියන් විසින් වැවිලි කර්මාන්තයට දක්වන දායකත්වය සහ එම අංශයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ වැදගත්කම හදුනාගෙන ඇත. මෙම තත්ත්වය භාණ්ඩාගාරයට පැහැදිලි කිරීමෙන් පසුව ආයතනයේ අයවැයෙන් සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් කුඩා වතු හිමියන්ගේ ධාරිතාව සංවර්ධනය කිරීම යටතේ වෙන් කොට ඇත. කුඩා වතු හිමියන්ගේ දැනුම හා ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ආයතනය විසින් 2017 වසර සඳහා රු.මිලි 9 ක මූල්‍ය වෙන් කිරීමක් යටතේ පුහුණු වැඩසටහන් 180 ක් සැලසුම් කරන ලදී. වසර තුළදී ආයතනය විසින් කුඩා වතු හිමියන් සඳහා රු.මිලි 7.8 ක මුදලක් වැය කරමින් වැඩසටහන් 228 ක් පවත්වා ඇත. කුඩා වතු හිමියන් සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- මත් ද්‍රව්‍ය නිවාරණ
- ආකල්ප සංවර්ධන
- කලමනාකරණ සංවර්ධන
- ව්‍යවසාය සංවර්ධන
- තාක්ෂණික නිපුණතා සංවර්ධන

පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන් වල විස්තර වගු අංක 5 හි පරිදි වේ.

**කුඩා වතු හිමියන් සඳහා පැවැත්වූ ධාරිතා සංවර්ධන වැඩ සටහන්**

| වැඩසටහන් වර්ගය | අපේක්ෂා කල වැඩසටහන් | අපේක්ෂා කල සහභාගිවන්නන් | ඇස්තමේන්තු පිරිවැය | පැවැත්වූ වැඩසටහන් ගණන | සහභාගිවූවන් ගණන | පිරිවැය (රු.මිලි) |
|---|---|---|---|---|---|---|
| **රබර් කුඩා වතු හිමියන්** | 60 | 3,000 | 3.0 | 67 | 3272 | 2.24 |
| **තේ කුඩා වතු හිමියන්** | 50 | 2,500 | 2.5 | 58 | 3506 | 1.83 |
| **පොල් කුඩා වතු හිමියන්** | 60 | 3,000 | 3.0 | 81 | 4356 | 2.78 |
| **අනෙකුත් බෝග** | 10 | 500 | 0.5 | 22 | 1504 | 0.95 |
| **සාක්ෂාත් කර ගත් ගණන** | - | - | - | **228** | **12638** | **7.80** |
| **සැලසුම් කල ගණන** | **180** | **9,000** | **9.0** | - | - | - |
| **ප්‍රගතිය** | - | - | - | **127%** | **140%** | **87%** |

(වගුව 5)





මෙම කොටසින් වසර තුළදී ආයතනය විසින් වැඩසටහන් 228 ක් පවත්වා 127% ක ප්‍රගතියක් වාර්තා කරමින් 2017 වසර සඳහා ඇස්තමේන්තු කල ප්‍රමාණයටත් වඩා සහ අපේක්ෂිත පුහුණු වන්නන් සංඛ්‍යාවද ඉක්මවමින් කුඩා වතු හිමියන් 12,638 ක් පුහුණු කරමින් 140% ක ප්‍රගතියක් වාර්තා කර ඇත.2017 වසරේදී මෙම වැඩසටහන් සඳහා වැය කර ඇති පිරිවැය රු.මිලි 7.80 කි. එය වෙන් කරන ලද අරමුදල් වලට සාපේක්ෂව 87% ක මූල්‍ය ප්‍රගතියකි .

## පාසල් අධ්‍යාපනය නිමවූ සිසුන් සඳහා ජාතික වෘත්තීය සුදුදුකම් (NVQ) 4 මට්ටමේ නිපුණතා සංවර්ධන වැඩසටහන්

කෂේත්‍රයට අවශ්‍ය කරන සුදුසුකම් ලත් පුහුණුලාභීන් පිරිසක් හඳුන්වා දෙමින් (NVQ) 4 මට්ටමේ තේ කර්මාන්තශාලා නිලධාරී, තේ ක්ෂේත්‍ර නිලධාරී පාඨමාලාවන් සාර්ථකව නිම කිරීමට හැකිවිය. ජාතික වෘත්තීය සුදුසුකම යනු කාර්යය පදනම් කරගත් සුදුසුකමකි. රැකියාවක් කිරීමට අවශ්‍ය දැනුම කුසලතා වලින් යුත් පරිපූර්ණ පුද්ගලයෙකු බිහි කිරීම මෙහි අරමුණයි.

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ආකෘතිය අනුව ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් වතු ක්ෂේත්‍රයේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා පහත NVQ 04 මට්ටමේ පාඨමාලා සාර්ථකව පවත්වන ලදී.

මෙම පාඨමාලා වල අරමුණු පහත පරිදි වේ.

### තේ කර්මාන්තශාලා නිලධාරී

- තේ නිෂ්පාදනයේ තාක්ෂණික සහ කළමනාකරණ අංශ පිළිබඳව පුහුණු අවස්ථාවන් සැපයීම.

- කර්මාන්තශාලා මට්ටමින් තීරණ ගැනීමට සහ කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සඳහා තොරතුරු භාවිතා කරමින් කාර්යක්ෂමව සහ ඵලදායීතාවයකින් යුක්තව කාර්යයන් සිදු කිරීම සඳහා කර්මාන්තශාලා හා කාර්යාල කටයුතු පිළිබඳ දැනුම හා අවබෝධය වැඩි කිරීම.

- ආධුනික තේ කර්මාන්තශාලා නිලධාරීන් ලෙස වඩාත් සුදුසු අයදුම්කරුවන් හඳුනා ගැනීම සහ තෝරාගැනීම සඳහා වැවිලි සමාගම් සහ පෞද්ගලික තේ කම්හල්වලට අවස්ථාව ලබාදීම.

### තේ ක්ෂේත්‍ර නිලධාරී

- විධිමත් කෘෂිකාර්මික හා කෂේත්‍රගත පුහුණුවකින් පසු වතු පරිපාලනය මෙන්ම වෘත්තීය නිපුණතා වලින් හෙබි ක්ෂේත්‍ර නිලධාරීන් බිහිකිරීම සඳහා කෘෂිකාර්මික දැනුම , තේ වතු ඉඩම් කළමණාකරණය ආදී කෂේත්‍ර සඳහා න්‍යායාත්මක, තාක්ෂණික සහ කළමනාකරණය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීම.

- ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස වඩාත් යෝග්‍ය තරුණ පුහුණුලාභීන් හඳුනාගැනීම සහ තෝරාගැනීම සඳහා තේ වතු සමාගම් සහ තේ වතු හිමියන් සඳහා අවස්ථාව සැලසීම.

මෙම වර්ෂයට අදාලව සැලසුම් කල තේ ක්ෂේත්‍ර නිලධාරී සහ තේ කර්මාන්තශාලා නිලධාරී පාඨමාලා සාර්ථකව නිම කිරීමට ආයතනයට හැකිවිය. තවද එම පාඨමාලා නිම කල සියලුම සිසුන්ට රැකියා අවස්ථා සොයා ගැනීමට හැකිවීම මෙම පාඨමාලාවලින් ලද ඉහලම ජයග්‍රහණයකි. එළඹෙන වසරේදී මෙම වැඩසටහන් සඳහා සිසුන් 100 කට අධික සංඛ්‍යාවක් ලියාපදිංචි කිරීමට ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සැලසුම් කර ඇත.

**පෙර වසරට සාපේෂව පුහුණු වැඩසටහන් ලබා ඇති ප්‍රගතිය.**

පසුගිය වසරේ පුහුණු සංඛ්‍යා ලේඛන සමඟ සසඳන විට 2017 වසරේදී වැඩසටහන් සංඛ්‍යාව, පුහුණු වූ සංඛ්‍යාව, පුහුණු ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කළ ආදායම සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කර ඇත.

2016 වසර හා සසඳන විට වැඩ සටහන් පැවැත්වීම 50% කින් ද ආදායම් උත්පාදන වැඩසටහන් සඳහා සහභාගී වන්නන්ගේ ප්‍රමාණය 57% කින්ද වර්ධනය වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී පුහුණු ආදායම 24% කින් වර්ධනය වී ඇත.

කුඩා වතු හිමි අංශය සැලකිල්ලට ගැනීමේදී පුහුණු වැඩසටහන් 43% කින්ද වැඩසටහන් වල වැඩි වීමට සමාන්තරව පුහුණු සඳහා සහභාගී වන්නන්ගේ සංඛ්‍යාව 17% කින්ද වැඩි වී ඇත. පහත දැක්වෙන වගුව (අංක 6) මඟින් 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී ඇති වූ ප්‍රගතිය පෙන්නුම් කරයි.

**2016 වසරට සාපේක්ෂව 2017 වසරේ ප්‍රගතිය**

| | 2016 | 2017 | ප්‍රතිශතය වැඩි වූ/(අඩු වූ) |
|---|---|---|---|
| **වැඩසටහන් ගණන (ආදායම් උත්පාදන වැඩසටහන්)** | 22 | 33 | 50% |
| **සහභාගී වූවන් ගණන (ආදායම් උත්පාදන වැඩසටහන්)** | 587 | 920 | 57% |
| **පුහුණු ආදායම (රු.මිලි)** | 12.81 | 15.85 | 24% |
| **කුඩා වතු හිමියන් සඳහා වූ වැඩසටහන් ගණන** | 160 | 228 | 43% |
| **පුහුණුව ලැබූ කුඩා වතු හිමියන් ගණන** | 10840 | 12638 | 17% |
| **කුඩා වතු හිමියන්ගේ පුහුණුව සඳහා වැය වූ පිරිවැය (රුඃ මිලියන)** | 7.18 | 7.80 | 9% |

**(වගුව 6)**

**වෙනත් ආයතන සඳහා විභාග පැවැත්වීම**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ එක් අරමුණක් වනුයේ වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් විවිධ විෂයන් සඳහා උපදේශන සේවා සැපයීමයි. 1987 සිට ආයතනය විසින් වැවිලි අංශයේ විශේෂඥයන් වූ විවිධ රාජ්‍ය/පෞද්ගලික අංශ ආයතන වල සේවකයන් ප්‍රවර්ධනය කිරීම සහ නව සේවකයන් බඳවා ගැනීමට අදාල වන විභාග පැවැත්වීමේ පහසුකම් සපයනු ලැබේ. පෙර වසර වල අත්දැකීම් වලට අනුව 2017 වසරේදී ආයතනය විසින් විභාග 22 ක් පවත්වා රු.මිලි 1.765 ක ආදායමක් උපයා ඇත. පහත දැක්වෙන වගු අංක 7 න් එම විභාග වල තොරතුරු නිරූපනය කරනු ලබයි.

## 2017 වසරේදී පැවැත්වූ විභාගයන්

| ආයතන | විභාග ගණන | අයදුම්කරුවන් ගණන | ඉපයූ ආදායම් (රු.) |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා තේ මණ්ඩලය** | 18 | 821 | 1.139 |
| **තේ පර්යේෂණ ආයතනය** | 03 | 191 | 0.497 |
| **අපනයන සංවර්ධන මණ්ඩලය** | 01 | 16 | 0.129 |
| **එකතුව** | 22 | 1028 | 1.765 |

( වගුව 7)

## වැව්ලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව



ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය හා වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැව්ලි කළමනාකරණ පීඨය ඒකාබද්ධව එම ආයතනයන්හි සහ අනෙකුත් ශාස්ත්‍රීය, පර්යේෂණ හා කළමනාකරණ ආයතන වල සම්පත් දායකත්වය ලබාගැනීමේ අරමුණින් යුක්තව වැව්ලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ඇරඹීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමැතිය 2000 වර්ෂයේදී ලබා ගන්නා ලදී.

වැව්ලි ක්ෂේත්‍රයේ කළමනාකරණ හෝ විධායක මට්ටමේ නිලධාරීන්ගේ අධ්‍යාපන මට්ටම උපාධිය දක්වා රැගෙන යාමට අවස්ථාවක් අතීතයේදී සැකසී නොතිබුණි. එබැවින් ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය දේශිය විශ්ව විද්‍යාලයක් හා ඒකාබද්ධව වැව්ලි ක්ෂේත්‍රයේ නියුතු ජ්‍යෙෂ්ඨ ඕනෑම මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්, විධායක නිලධාරීන්, කාර්මික නිලධාරීන් මෙහි ඉලක්කගත කණ්ඩායම වන ලදී.

ශ්‍රිලංකා ඉතිහාසයේ වැව්ලි කළමනාකරණය පිළිබඳ උපාධියක් පිරිනැමු ප්‍රථම අවස්ථාව මෙය වන අතර ඒ අනුව විශාල පරිශ්‍රමයක් යොදා තුන් අවුරුදු දුරස්ථ අධ්‍යාපන පාඨමාලාවක් ලෙස 2006 වර්ෂයේදී වැව්ලි කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ආරම්භ කරන ලදී.

මෙම උපාධි පාඨමාලාවෙහි අරමුණු පහත පරිදි වේ.

අ. වැඩි දියුණු කරන ලද වැව්ලි භෝග තාක්ෂණය හා කළමනාකරණ පැතිකඩ පිළිබඳ විද්‍යාත්මක පසුබිමක් සැපයීම.

ආ වැව්ලි කළමනාකරුවන්ට හා විධායක නිලධාරීන්ට තාක්ෂණික දැනුම,බාහිර පරිසරය,වැව්ලි බෝග පිළිබඳ වෙළඳපොල , ප්‍රවාහනය, පාරිභොගික හැසිරීම හා සමාජ ප්‍රවනතා ආදිය මගින් ගෝලීය වෙනස්කම් හදුනාගැනීම සඳහා සහය ලබාදීම.

ඇ නිෂ්පාදන, තාක්ෂණික වෙළඳපල ,ශ්‍රම හා කළමනාකරණ ගැටළු පිළිබඳ සුක්ෂම හා සාර්ව පදනම් මත කුසලතා වර්ධනය කිරීම.

මෙම උපාධි පාඨමාලාව හැදීරීම සඳහා වැව්ලි කළමනාකරණ සමාගම්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, තේ මණ්ඩලය, පොල් වගා කිරීමේ මණ්ඩලය, භෝග පර්යේෂණ ආයතනය (TRI, RRI, CRI, SRI) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, ෂත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රීලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව, මහවැලි අධිකාරිය,බැංකු සහ අනෙකුත් රට තුල ඇති අදාල ආයතන වල නිලධාරීන් ඉලක්කගත කණ්ඩායම් වේ.

එක් එක් වසර වලදී ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව හා එම පාඨමාලාව සාර්ථකව අවසන් කළ සිසුන් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

**ලියාපදිංචි හා සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව**

| | වසර | ලියාපදිංචි සිසුන් ගණන | නිම කළ සිසුන් ගණන |
|---|---|---|---|
| 1 | 2006 | 21 | 16 |
| 2 | 2007 | 17 | 11 |
| 3 | 2008 | 35 | 21 |
| 4 | 2009 | 34 | 16 |
| 5 | 2010 | 47 | 29 |
| 6 | 2011 | 32 | 17 |
| 7 | 2012 | 54 | 37 |
| 8 | 2013 | 81 | - |
| 9 | 2014 | 91 | 52 |
| 10 | 2015 | 105 | 17 |
| 11 | 2016 | 121 | 37<br><br>33 |
| 12 | 2017 | 117 | 48 |
| 13 | 2018 | 143 | - |

**(වගුව 8)**

 

## වෙනත් ආයතන හා සම්බන්ධතා

### ***දේශීය***

වැවිලි ක්ෂේත්‍රය සඳහා මානව සම්පත් කළමනාකරණය පිළිබඳව ඒකාබද්ධ වැඩසටහන් පැවැත්වීම උදෙසා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය , මානව සම්පත් කළමනාකරණ ආයතන සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ගිවිසුම 2017 ජනවාරි මාසයේ අත්සන් කෙරුනු අතර , 21 දෙනෙකුගේ කණ්ඩායමක් සඳහා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ මූලික පාඨමාලාව 2017 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

### ***විදේශීය***

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ කණ්ඩායමක් , තායිලන්තයේ සියෑම් විශ්ව විද්‍යාලය සහ කටුපොල් වගාවේ සහ බීජ නිශ්පාදනය කරනු ලබන සමගම් දෙකක සංචාරයක යෙදින. මෙම සංචාරයේ ප්‍රධාන අරමුණ වූයේ පශ්චාත් උපාධි, කෙටි කාලීන පාඨමාලා සහ වෙනත් ක්‍රියාකාරකම් ඒකාබද්ධ වී සිදු කිරීමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යයනය කිරීම සහ සාකච්ඡා කිරීමයි. කටුපොල් වගාව හා නිශ්පාදනය පිළිබඳව පුහුණු වැඩටහනක් පැවැත්වීමට කටුපොල් සමාගම් සමග සම්බන්ධතාවයන් ගොඩනගා ගැනීමට මෙහිදී හැකියාව ලැබුණි.

## ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය

1987 අංක 05 දරන සංශෝධන පනතේ සඳහන් නිර්නායක හා කොන්දේසි මත පදනම්ව ආයතනය විසින් යෝග්‍ය සාමාජිකයන් සඳහා වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීම අඛණ්ඩව කරගෙන යනු ලබයි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල ආයතනය විසින් එක් ආශ්‍රිත සාමාජිකයෙකු සම සාමාජිකයෙකු ලෙස උසස් කළ අතර, සම සාමාජිකත්වය විධායක නිලධාරීන් 6 දෙනෙකුට පිරිනමන ලදී. වසර අවසානයේදී එක් එක් ඛාණ්ඩ යටතේ සිටින මුළු වෘත්තීය සාමාජිකයන් ගණන පහත පරිදිය.





| | |
|---|---|
| **ගරු සාමාජිකත්ව** | **20** |
| **සම සාමාජිකත්ව** | 219 |
| **ආශ්‍රිත සාමාජිකත්ව** | 16 |
| **ශිෂ්‍ය සාමාජිකත්ව** | 02 |
| | 257 |

වගුව අංක 09

2017 වසරේදී සාමාජිකයින් 53 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වැවිලි ක්ෂේත්‍රයට බලපාන ආර්ථික උපනතින් පිළිබඳව යාවත්කාලීන කිරීම උදෙසා සහ වැවිලි ක්ෂේත්‍රයේ වර්තමාන උපනතීන් සාමාජිකයින් අතර හුවමාරු කිරීමේ අරමුණින් වැඩමුළුවක් 2017 ජූලි මාසයේ තූර්යා හෝටලයේදී පැවැත්විණි.

## ප්‍රකාශන




ආයතනය විසින් 2015 වසරට පෙර සගරා නිකුතු 2ක් සහ පුවත් පත්‍රිකා 4ක් ප්‍රකාශයට පත් කරන ලදී. 2016 වර්ෂයේදී මෙම සඟරාව හා පුවත් පත්‍රිකාව යන දෙක වෙනුවට " වැවිලි සවිය" නමින් නව සඟරාවක් නිකුත් කිරීමට තීරණය කරන ලදී. එහි බෝග පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, වෘත්තීය වැවිලිකරුවන්, කුඩා වැවිලි හිමිකරුවන් විසින් වැවිලි කර්මාන්තය හා සම්බන්ධව භාෂා 3 කින් ලියන ලද ලිපි ඇතුළත් වේ. එහි කතෘ මණ්ඩලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ආචාර්ය ප්‍රියානි සෙනෙවිරත්න මිය, රබර් පර්යේෂණ ආයතනය, බී.ඒ.ඩී සමන්සිරි මහතා, තේ පර්යේෂණ ආයතනය, ආචාර්ය කුසුම් විජේසිංහ මිය, පොල් වගා කිරීමේ මණ්ඩලය යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විතය. ප්‍රධාන කතෘ වනුයේ එස්.එම්.පී. ජයන්ත මහතාය.

## ආයතනය සපයන පහසුකම්

### පුස්තකාල පහසුකම්



ආයතනික පුස්තකාලයේ තේ, රබර්, පොල්, උක්, කජු සහ ගිණුම්කරණය, පොදු කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, අලෙවි කලමනාකරණය, උපාය මාර්ගික කළමනාකරණය, ධනාත්මක චින්තනය, කාල කළමනාකරණය, ඵලදායීතාවය, කාර්මික ආරක්ෂණය, ස්වස්ථාව හා තත්ත්ව කළමනාකරණය, ආදි වැවිලි කර්මාන්ත අංශයට අදාළ ග්‍රන්ථ 4000 කට වැඩි එකතුවක් ඇත. එහි බැහැර දෙන සහ පරිශීලන නමින් අංශ 2 ක් ඇත. දිගු කාලීන වැඩ සටහන්වලට සහභාගී වන පිරිසට සහ ආයතනික කාර්යය මණ්ඩලයට බැහැර දෙන අංශයේ ග්‍රන්ථ භාවිතා කල හැකි අතර කෙටිකාලීන වැඩසටහන් සදහා සහභාගී වන පිරිස, කාර්යය මණ්ඩලය ආයතනයේ බාහිර සම්පත්දායක මණ්ඩලය හා ප්‍රදේශයේ පාසැල් ශිෂ්‍යයන් සදහා පරිශීලන අංශය භාවිතා කල හැකිය.

## නවාතැන් පහසුකම්



ආයතනය සතුව අධ්‍යාපනික හා පුහුණු මධ්‍යස්ථානයකට අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් ඇත. දේශීය හා විදේශීය ඉල්ලුම තෘප්ත කිරීමට හැකිවන පරිදි ආයතනය වැඩි දියුණු කිරීමට හා නවීකරණය කිරීමට ජාතික අයවැය මගින් වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. අතුරුගිරිය පුහුණු මධ්‍යස්ථානයේ වායු සමීකරණය කරන ලද දේශණ ශාලා 3 ක් හා ශ්‍රවණාගාරයක් ඇත. ශ්‍රවණාගාරයේ වරකට පුද්ගලයින් 200 කට ඉඩ පහසුකම් සැලසිය හැකිය. 60 දෙනෙකු සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයිය හැකිය.





**නේවාසිකාගාරය - අතුරුගිරිය**

බොගවන්තලාව තෙරේසියා වත්තේ පිහිටා ඇති රංජන් විජේරත්න වැවිලි පාසල (RWPS) යනු අපගේ අනෙක් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය යි. එය අනිවාර්යෙන්ම නව පුහුණු පහසුකම් සහිතව වැඩි දියුණු විය යුතු ය. එහි ශ්‍රවණාගාරයේ පුද්ගලයන් 100 කට ආසන්න ප්‍රමාණයක ධාරිතාවක් ඇති අතර, 50 දෙනෙකුට ඉඩ පහසකම් සැපයිය හැකි මධ්‍යම පරිමාණ දේශන ශාලා 2 ක් ඇත.

**නේවාසිකාගාරය - බගවන්තලාව**




බොගවන්තලාව නේවාසිකාගාරයේ වරකට පුද්ගලයන් 70 කට ආසන්න ප්‍රමාණයකට නවාතැන් පහසුකම් සැපයිය හැකිය. මෙහි විශාල භෝජනාගාරයක්, කාර්යාල කාමර 3 ක් හා ග්‍රන්ථ 600 කට වඩා ඇති කුඩා පුස්තකාලයක් ඇති අතර නේවාසිකාගාර කළමණාකරු සඳහා බංගලාවක් ඇත. මෙහි නේවාසිකාගාර කළමණාකරු හා කාර්යාල කාර්ය සහයක

හැරුණු විට කිසිදු ස්ථිර සේවකයෙකු නොමැත. එම නිසා පුහුණු සැසි සඳහා අධ්‍යක්ෂතුමාගේ පූර්ව අනුමැතිය යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගනී. මෙහි අනියම් පදනම යටතේ සේවකයන් 3 දෙනෙකු සහ එක් මුරකරුවකු සේවය කරන අතර ආයතනයේ පුහුණු වැඩසටහන් සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කොරියානු වැඩසටහන්වලට අදාළ සියලුම පහසුකම් මොවුන් විසින් නේවාසිකාගාර කළමනාකරුගේ අධීක්ෂණය යටතේ සපයනු ලබයි.

අතුරුගිරිය සහ බගවන්තලාව යන පුහුණු මධ්‍යස්ථාන දෙකෙහිම පහසුකම් වෙනත් ආයතනය වලට සැපයීම මගින් උපයන ආදායමෙහි සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරයි.2015 සිට 2017 දක්වා එම ප්‍රගතිය පහත ප්‍රස්තාර අංක 03හි පෙන්නුම් කර ඇත.




***අපගේ ක්‍රියාකාරකම්***



**2017 වර්ෂය සඳහා කාර්ය කටයුතු ආරම්භය**

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ සභාපති / අධ්‍යක්ෂ විධායක නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලය 2017 වසරේ වැඩ කටයුතු ආරම්භ කරමින් ජාතික ධජය ඉදිරියේ රාජ්‍ය සේවා ප්‍රතිඥාව ලබා දීමේ අවස්ථාව

**කුඩා වතු හිමියන්ගේ ව්‍යවසායකත්වය සංවර්ධන පුහුණු වැඩසටහනේ සහතිකපත්‍ර ප්‍රදානොත්සවය**

කුඩා වතු හිමියන්ගේ ව්‍යවසායකත්වය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභී කුඩා වතු හිමි පවුල්වල තරුණ තරුණියන් 30දෙනෙකු සඳහා නායකත්ව හා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් සාර්ථකව නිම කිරීම නිමිත්තෙන් සහතිකපත්‍ර ප්‍රධානය





**වාර්ෂික සහතික පත්‍ර ප්‍රදානෝත්සවය, BMICH, 2017 මාර්තු 31 වෙනිදා**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ විවිධ පාඨමාලා සාර්ථකව නිම කල සිසුන්ට ගරු අමාත්‍ය නවීන් දිසානායක මැතිතුමාගේ සුරතින් සහතික පත්‍ර ප්‍රධානය

**බක් මහා උළෙල**

2017 වසරේ ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා සංවිධානය කරන ලද නව අවුරුදු උළෙල





**ඩෙංගු වර්ධන වැඩසටහන**

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතාගේ මගපෙන්වීම හා කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් පවත්වන ලද ඩෙංගු මර්ධන වැඩසටහන



**මහනුවර පැවති ප්‍රදර්ශනය**

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය මගින් මහනුවර නගර ශාලාවේ පවත්වන ලද පාසැල් හැරගිය සිසුන්ට වැව්ලි ක්ෂේත්‍රයේ උපාධියක් දක්වා පිරිනැමීමට අවස්ථාව උදා කීරීම සඳහා දැනුවත් කිරීමට පැවැති ප්‍රදර්ශනය



2017 දෙසැම්බර් මස පවත්වන ලද වාර්ෂික පිරිත් ධර්ම දේශනය



**ක්‍රිකට් තරඟාවලිය**

සහෝදර ආයතන සමඟ සුහඳතාවය වර්ධනය කර ගැනීම සඳහා 2017 ඔක්තෝම්බර් 22 වෙනිදා පොල් පර්යේෂණ ආයතනය සමග පැවති සුහද ක්‍රිකට්

# සමාජ සේවා කටයුතු



ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය මගින් ඔරුවල විද්‍යාලයට වයිට් බෝඩ් ප්‍රදානය



අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සහභාගීත්වයෙන් ඔරුවල ප්‍රාථමික විද්‍යාලයට ඔසුපැල ප්‍රදානය කිරීමේ උත්සවය



2017 මැයි මස ආයතනය අවට ගංවතුරෙන් විපතට පත් ජනතාව හට වියළි සලාක හා වතුර බෝතල් ප්‍රදානය කිරීමේ අවස්ථාව

# මූල්‍ය සමාලෝචනය

## කාර්ය සාධනය

2017 වර්ෂයේ රුඃ මිලියන 115.395 ක මුළු ආදායමක් වාර්තා කල අතර පසුගිය වසරේ එම ආදායම රුඃ මිලියන 101.828 කි. ඒ හා සැසඳීමේදී 13.3% ක වර්ධනයක් වාර්තා කර ඇත. මේ සඳහා මූලික වශයෙන් ජාතික අයවැය මගින් ලබාදුන් රාජ්‍ය ප්‍රදානය වන රුඃ මිලියන 59.874 ක දායකත්වය ඉවහල් විය. මුළු පුහුණු ආදායම රුඃ මිලියන 15.853 ක් වූ අතර මෙම ආදායමද උපයන ලද ආදායම සඳහා සඵල දායකත්වයක් ලබා දී ඇත. මෙයට අමතර වශයෙන් ආයතනයේ පුහුණු පහසුකම් ඉහල නැංවීමේ ව්‍යාපෘතිය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් ලබා දුන් රුඃ මිලියන 15.3 ක මුදලද ආදායම් වැඩි වීම කෙරෙහි බලපාන ලදී. පසුගිය වර්ෂයන්ගේ මෙන් ආයතනයේ බගවන්තලාව සහ අතුරුගිරිය පහසුකම් කුලියට ලබා දීම මගින් සැලකිය යුතු ආදායමක් උපයා ඇති අතර එම අගය රුඃ මිලියන 10.983 කි. 2017 වසරේ මුළු පුනරාවර්තන වියදම රුඃ මිලියන 107.119 ලෙස වාර්තා වුන අතර රුඃ මිලියන 20.533 ක වත්කම් ක්ෂය අඩු කිරීමෙන් පසු රුඃ මිලියන 8.276 ශුද්ධ අතිරික්තයක් 2017 වසරේදී වාර්තා විය.

පසුගිය වසරට සාපේක්ෂව මූල්‍ය කාර්ය සාධනයේ සාරාංශය පහත සඳහන් වේ. (රු. මිලි.)

| | 2017 | 2016 | වෙනස | කාරණය |
|---|---|---|---|---|
| **රජයේ ප්‍රදාන** | 59.874 | 71.65 | (16.43%) | අපේක්ෂිත ප්‍රදානයන්ට වඩා රුඃ මිලියන 10.126 කින් භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදානයන්ගේ දායකත්වයේ ඌණ ප්‍රදානය හේතු විය. |
| **පුහුණු ආදායම** | 15.853 | 12.787 | 23.97% | 2016 ට සාපේක්ෂ පුහුණු වැඩ සටහන් ප්‍රමාණයේ වැඩි වීම බලපාන ලදී. |
| **පහසුකම් කුලියට දීමෙන් ලද ආදායම (බගවන්තලාව සහ අතුරුගිරිය)** | 10.983 | 14.232 | (22.82%) | ආයතනයේ නවාතැන් පහසුකම් සීමිත බව හා කොරියානු වැඩ සටහන්හි ඉල්ලීම අඩු වීම මෙම ආදායම්හි අඩු වීම කෙරෙහි බලපාන ලදී. |
| **ඉපයූ මුළු ආදායම** | 40.221 | 30.178 | 33.27% | ණයහිමියන්ට ගෙවීම් අත්හැර දැමීම වැනි වෙනත් ආදායම් ප්‍රමාණයන්ගේ වැඩි වීම මත මුළු ආදායම ඉහල යාම සමග ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය මගින් රුඃ මිලියන 15.3 ක ප්‍රතිපාදන ලැබීම මේ සඳහා ඉවහල් වී ඇත. |
| **වැටුප් හා වේතන හා සේවක ප්‍රතිලාභ** | 38.796 | 32.571 | 19.1% | 2017 වසරේ නව බඳවා ගැනීම් සහ රජයේ සේවක වැටුප් වැඩි වීම හේතුවෙන් 2017 වසරේ වැටුප් පිරිවැය වැඩි වීමක් පෙන්නුම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| **මුළු පුනරාවර්තන වියදම්** | 107.119 | 87.070 | 23.06% | සේවක වැටුප් වැඩි වීම, පුහුණු පිරිවැය සහ ධාරිතා සංවර්ධන පිරිවැය වැඩි වීම මත මුළු පුනරාවර්තන පිරිවැය වැඩිවීම කෙරෙහි බලපාන ලදී. |
| **ක්ෂය කිරීම්** | 20.533 | 18.951 | 8.34% | නව මිලදී ගැනීම් හේතුවෙන් ක්ෂය පිරිවැය වැඩි වී ඇත. |
| **අතිරික්තය** | 8.276 | 14.757 | (43.91%) | සේවක වැටුප් වැඩි වීම, රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගේ ඌණතාවය හේතුවෙන් ආයතනයේ සමස්ථ අතිරික්තයේ අඩු වීමක් පෙන්නුම් කර ඇත. |

(වගුව 10)

## ද්‍රවශීලතා තත්වය

2017 වසරේ ද්‍රවශීලතා අනුපාතය 1.58 වරක් වන අතර පසුගිය වසරේ අනුපාතය 2.04 කි. එම අගයට සාපේක්ෂව සුළු අඩු වීමක් 2017 වර්ෂයේදී පෙන්නුම් කරයි. මෙය ජංගම වගකීම් වල රුː මිලියන 5.953 ක වැඩි වීම හේතු කොට ගෙන සිදු වි ඇති අතර ඒ සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන්ගේ මුදල රුː මිලියන 10.126 කින් අඩු වීම බලපාන ලදී.

## ප්‍රාග්ධන වියදම්

ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ සටහනට අදාලව ස්ථාවර වත්කම් සංවර්ධනය කිරීම 2017 වර්ෂයේදී අඛණ්ඩව සිදු කරන ලදී. මේ සඳහා මහා භාණ්ඩාගාරය 2017 වසරේ රුː මිලියන 30.0 ක ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කල අතර රජයට මුහුණු දීමට සිදු වූ දුෂ්කරතාවයන් මත රුː මිලියන 19.874 ක පමණක් ආයතනය වෙත නිදහස් කරන ලදී. පහත දැක්වෙන වගුව මගින් 2017 වසරේ ප්‍රාග්ධන මූල්‍ය වැඩි කිරීම පිළිබඳව පෙන්නුම් කර ඇත. මෙයට අමතරව රුː මිලියන 15.3 ක් වූ මුදලක් පුහුණු පහසුකම් සංවර්ධනයට අදාල ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ප්‍රථම අදියර වශයෙන් ලබා දෙන ලදී. මෙම ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුː මිලියන 264.0 ක මුළු ප්‍රතිපාදන 2017 - 2020 කාල රාමුව තුළ වැය කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර ඉන් රුː මිලියන 47.1 ක් උපයන ආදායම් මගින් ආයතනය දායකත්වයක් යෙදවිය යුතුවේ.

2017 ප්‍රාග්ධන වියදම්හි අයවැයගත හා සත්‍ය කාර්ය දර්ශනය (රු: මිලියන)

| ප්‍රාග්ධන අයිතම | අයවැය | සත්‍ය | ප්‍රගතිය |
|---|---|---|---|
| **ප්‍රාග්ධන වත්කම් හා අළුත්වැඩියා හා පුනරුත්ථාපනය** | 14.16 | 12.66 | 89.3% |
| **ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම** | 4.34 | 3.63 | 83.6% |
| **වෙනත් ආයෝජනයන්** | 1.20 | 0.151 | 12.5% |
| **ධාරිතා සංවර්ධන වැඩ සටහන්** | 12.05 | 10.18 | 84.5% |
| **මුළු එකතුව** | 31.75 | 28.62 | 83.8% |

(වගුව 11)

ප්‍රධාන ප්‍රාග්ධන සංවර්ධන ක්‍රියාකාරකම් පහත සඳහන් වේ.

- අතුරුගිරිය ප්‍රධාන කාර්යාල සංකීර්ණයේ හා බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය
- දේශන ශාලා සඳහා AC යන්ත්‍ර සවි කිරීම.
- කුඩා වතු හිමියන් සඳහා ධාරිතා සංවර්ධන වැඩ සටහන් 230 ක් සිදු කිරීම.
- ධාරිතා සංවර්ධන වැඩ සටහන් යටතේ පාසැල් හැර ගිය සිසුන් සඳහා NVQ 4 වන මට්ටමේ වැඩ සටහන් 2 ක් සංවිධානය කිරීම.
- අතුරුගිරිය නේවාසිකාගාරයේ වහලය වැඩි දියුණු කිරීම
- බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය සඳහා ලී බඩු මිලදී ගැනීම
- දෙනියාය පුහුණු මධ්‍යස්ථානය සඳහා ලී බඩු මිලදී ගැනීම

## විශේෂ සංවර්ධන ව්‍යාපෘතිය

ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශය හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ආයතනයේ පුහුණු පහසුකම් වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනයට අනුකූලව වැඩි දියුණු කිරීම සමග උපාධි පිරිනමන ආයතනයක් දක්වා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2017 වසරේ ආරම්භ කරන ලදී. මෙහි මුළු ඇස්තමේන්තුගත ආදායම රු: මිලියන 314.0 ක් වන අතර ඉන් රු: මිලියන 264.0 ප්‍රාග්ධන වැය කොටසට අදාල වන අතර රු: මිලියන 50 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් ඇස්තමේන්තුගත කර ඇත.

මහා භාණ්ඩාගාරයෙන් රු: මිලියන 216.9 ක මුදලක් ප්‍රතිපාදන ලබා ගැනීමට නියමිත අතර රු: මිලියන 47.1 ක් ශ්‍රී ලංකා යුධ හමුදාවට පවරා ගන්නා ලද ඉඩමෙන් ලැබිය යුතු මුදලින් මූලනය කිරීමට ආයතනය සැලසුම් කර ඇත.

**සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රාග්ධන වියදම් (රුඃ මිලියන)**

| උපාධි පිරිනමන ආයතනයක් දක්වා ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ පුහුණු පහසුකම් වැඩි දියුණු කිරීම | | 2017 වසරේ ප්‍රතිපාදන | 2017.12.31 දක්වා වියදම | 2018 | 2019 | 2020 | රාජ්‍ය මුදල් | උපයන ආදායම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **මුළු ව්‍යාපෘති වියදම** | | | | | | | | | |
| **ව්‍යාපෘති ප්‍රාග්ධන වියදම** | | | | | | | | | |
| 2001 | නේවාසිකාගාර පහසුකම් වැඩි දියුණු කිරීම | 11.7 | 11.7 | 2.00 | - | - | 11.7 | 2.00 | 13.7 |
| 2104 | දේශන ශාලා සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය සහිත නව ගොඩනැගිල්ල | 0.6 | 0.6 | 59.0 | 137.6 | 45.1 | 197.2 | 45.1 | 242.3 |
| 2507 | පාඨමාලා සංවර්ධන හා පිරිවැය | 3.0 | 3.0 | 1.0 | 4.0 | - | 8.0 | - | 8.0 |
| **මුළු ප්‍රාග්ධන පිරිවැය** | | **15.3** | **15.3** | **62.0** | **141.6** | **45.1** | **216.9** | **47.1** | **264.0** |

| | |
|---|---|
| මුළු ව්‍යාපෘති පිරිවැය රුඃ මිලියන | 314.0 |
| 2017 වසරේ ප්‍රතිපාදන | 15.3 |
| 2018 වසරේ ප්‍රතිපාදන රාජ්‍ය මුදල් | 60.00 |
| 2019 වසර සඳහා අයවැයගත ප්‍රතිපාදන රාජ්‍ය මුදල | 141.60 |
| 2018 උපයන ආදායම මගින් රුඃ මිලියන 2.00 | 47.1 |
| 2020 වසරේ රුඃ මිලියන 45.1 | |
| අපේක්ෂිත මුළු ප්‍රාග්ධන වියදම | 264.0 |
| පුනරාවර්තන වියදම් | 50.0 |

(වගුව 12)

## අතිරික්තය/(හිගය)

රු: මිලියන 20.533 ක් වූ ක්ෂය පිරිවැය අඩු කිරීමෙන් පසු රු: මිලියන 8.276 ක අතිරික්තයක් සමාලෝචිත වසරේ ආයතනය වාර්තා කර ඇත.

එය 2016 වසරේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට අනුව අතිරික්තය රු: මිලියන 14.757 ක් වන අතර 2009 වසරේ සිට 2017 වසරේ දක්වා ආයතනයේ ශුද්ධ අතිරික්තය හා හිගය හැසිරුණ ආකාරය පහත වගුවෙන් පෙන්වා ඇත.




(ප්‍රස්ථාර 4)

## ශුද්ධ වත්කම්

2017 දෙසැම්බර් 31 දිනට ආයතනයේ ශුද්ධ වත්කම් රු: මිලියන 232.817 දක්වා වර්ධනය වී ඇත.

එය පසුගිය වසරේ අගය වූ රු: මිලියන 203.830 ට සාපේක්ෂව 14.22% ක වැඩි වීමකි. 2017 වසරේ ශුද්ධ වත්කම් වැඩිවීම කෙරෙහි වාහන ප්‍රත්‍යාගණනය මගින් රු: මිලියන 23.55 ක (අතිරික්තයක් 2017 වසරේදී ජනිත වූ බැවින්) ශුද්ධ වත්කම් වැඩි වීම කෙරෙහි මෙය හේතු පාදක වී ඇත. පහත සඳහන් වගු ප්‍රස්ථාර 5 මගින් 2009 සිට 2017 වසර දක්වා ශුද්ධ වත්කම් වැඩි වීමේ ප්‍රවණතාවය පෙන්නුම් කර ඇත.




(ප්‍රස්තාර අංක 05)

## මූල්‍ය තත්වය

මූල්‍ය තත්ව ප්‍රකාශයට අනුව 2017/12/31 දිනට ශුද්ධ වත්කම් රු. මිලි 232.812 වන අතර එය පෙර වසරේදී රු. මිලි 203.880 කි. මූල්‍ය ප්‍රකාශයන්ට අනුව ආයතනයේ මුළු වත්කම් ප්‍රමාණය 2017 වසරේ රු. මිලි 263.47 වන අතර එය 2016 වසරේදී 228.849 ලෙස වාර්තා කර ඇත. වසරේ මුළු වගකීම් රු. මිලි 30.658 ට සාපේක්ෂව පෙර වසර අවසානයේදී මුළු වගකීම් ප්‍රමාණය රු. මිලි 24.969 කි. ආයතනය විසින් සේවක ප්‍රතිලාභ සැලැස්ම සඳහා රු. මිලි 7.313 ක් වෙන් කර ඇති අතර සේවක ප්‍රතිලාභ වල වගකීම සුරක්ෂා කිරීම සඳහා ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත. 2017/12/31 දිනට මුළු ජංගම වත්කම් ප්‍රමාණය රු. මිලි 36.713 ක් වන අතර ජංගම වගකීම් රු. මිලි 23.230 කි.

## ආයතනය විසින් මුහුණ දෙන සංරෝධක

පෙර වසරයන්හිදි පරිදි 2004 දී සිදු වූ ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලියෙන් පසුව 2017 වසර තුළද ආයතනය විසින් විවිධ සංරෝධකයන්ට මුහුණ දීමට සිදුවිය. පුහුණු අංශයේ පවතින කාර්ය මණ්ඩල හිඟය ඉන් එක් ප්‍රධාන කරුණකි. පුහුණු කාර්ය මණ්ඩලය 06 දෙනෙකු වන අතර සුදුසුකම් වලට සාපේක්ෂව ප්‍රමාණවත් වැටුප් පරිමාවන් නොතිබීම වැනි කරුණු හේතුවෙන් ආයතනය තුළ රැකියා අවස්ථා පැවතිය ද සේවකයින් අලුතින් බඳවා ගැනීමේ අපහසුතාවයන් පවතී. ශ්‍රී ලංකා හමුදා 7 වන ඉංජිනේරු රෙජිමේන්තුව විසින් ආයතනය සතුව පවතින අක්කර 4.5 ක භූමි භාගයක් අත්කර ගෙන සිටින බැවින් ආයතනයේ සේවක මණ්ඩලය සඳහා ප්‍රමාණවත් සේවක නිල නිවාස පහසුකම් හිඟයක් පවති.

බොහෝ වැවිලි ව්‍යාපාර ආයතන ඔවුන්ගේ නිෂ්පාදන හා පරිපාලන කටයුතු වලට බාධා ඇතිවන බැවින් වල විධායක නිලධාරීන්ව සතියේ දින වල පවතින දිගු කාලීන පුහුණු වැඩසටහන් වලට සහභාගි කරවීමට මැලිකමක් දක්වයි. එබැවින්

පුහුණු වැඩසටහන් සති අන්තයන්හිදී පැවැත්වීමට ආයතනයට සිදු වු අතර මෙය දේශන ශාලා හා නවාතැන් පහසුකම් සීමිත වීම කෙරෙහි බලපා ඇත.

වැව්ලි අංශය තරුණ පරම්පරාව අතර එතරම් ආකර්ෂණීය අංශයක් නොවන අතර පුහුණු වැඩසටහන් සඳහා පාසැල් හැරගිය පිරිසගේ සහභාගිත්වය අවම වේ. නව පරපුරේ නිපුනතාවය පිළිබඳව ගැටළු පැවතීම හේතුවෙන් වැව්ලි කර්මාන්ත ආයතන විසින් පහසුවෙන් බඳවා ගැනීම් සිදු නොකරන තත්වයක් තුල තෝරාගත් වෘත්තීන් වල පාඨමාලා විෂයධාරා සංවර්ධනය කිරීම සඳහා ආයතනයට වැඩිපුර අරමුදල් ආයෝජනය කිරීමට සිදු වන අතර ඒ සඳහා උපදේශකවරයකුගේ සේවය ලබා ගැනීමේ දි ආයතනයට ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුව තෝරා ගැනීමට සිදු වීම හේතුවෙන් විවිධ අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවිය.

1980 වර්ෂයේදී කාර්යාලීය ගොඩනැගිලි සංකීර්ණයක් බවට පරිවර්තනය කරන ලද ගොඩනැගිලි සංකීර්ණය වසර 60 කට වඩා පැරණි බැවින් එය අළුත්වැඩියා කිරීමේ අදියර පසු කර ඇත. යටිතල පහසුකම් සංවර්ධනය යටතේ නව කාර්යාලීය ගොඩනැගිලි ඉදි කිරීම අත්‍යවශ්‍යයෙන්ම සිදු කල යුතු කරුණකි.

වර්තමානයේ ආයතනය සතුව පවතින වාහන 08 න් 06 ක් වසර 20 කට වඩා පැරණි වන අතර පෙජරෝ රථය වසර 25 කට වඩා වැඩි වේ. එමෙන්ම කුඩා වැව්ලි හිමිකරුවන් සඳහා වැඩසටහන් පවත්වනු ලබන්නේ දිවයිනේ විවිධ ප්‍රදේශ වල බැවින් එවැනි දුර බැහැර ප්‍රදේශ වලට ගමන් කිරීම සඳහා පවතින වාහන සුදුසු මට්ටමක නොමැත. සේවායෝජකයන්ට වඩාත් ඵලදායි සේවාවක් සැපයීම සඳහා මෙම වාහන වෙනුවට නව වාහන ප්‍රතිස්ථාපනය කළ යුතු වේ.

තව දුරටත් දුර බැහැර ප්‍රදේශ වල වැඩසටහන් පැවැත්වීමේ දි ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ නිසියාකාරව ඇසුරුම් කර ප්‍රවාහනය නොකරන්නේ නම් එම උපකරණ වලට හානි සිදු වේ. නමුත් පවතින වාහන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ආරක්ෂිතව ප්‍රවාහනය සඳහා යෝග්‍ය නොවන බැවින් ජංගම පුහුණු ඒකකයක් ලෙස කටයුතු කිරීම සඳහා ආයතනය විසින් සුදුසු වාහන මිල දී ගැනිම සිදු කල යුතු වේ.

වැව්ලි ක්ෂේත්‍රයේ වතු වල අයිතිය රජය සතුව පැවතියද ප්‍රාදේශීය වැව්ලි සමාගම්හි වැව්ලි සේවකයින් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවත් පටිපාටියක් නොමැති වීම මත සහ විශේෂිත සුදුසුකම් පිළිබඳව එය ආයතනයේ නොසැලකීම මත සිසුන් ආයතනය වෙත ආකර්ශණය කිරීමේ යම් ගැටළුකාරී තත්වයක් පැන නැගී ඇත.

## අනාගත සැලසුම්

වසර 2020 වන විට උපාධි පිරිනැම්මේ ආයතනයක් ලෙස ස්ථාපනය කිරීමේ අරමුණින් NVQ 7 වන මට්ටම දක්වා ආයතනික පාඨමාලාවන් සංවර්ධනය කිරීම සඳහා ආයතනය පියවර ගෙන ඇත.යටිතල පහසුකම් හා පාඨමාලා සංවර්ධනය කිරීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් රු. මිලි 314 ක මුදලක් අනුමත කර ඇත. ඉහත සඳහන් කරුණට සමගාමීව පුද්ගලයන් 200 ක් දක්වා නේවාසිකාගාර පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා රු.මිලි 223 ක නව සංවර්ධන යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් එය නිර්දේශ කර ඇත.

2017 වර්ෂයේදී උපාධි පිරිනමන ආයතනයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රුඃ මිලියන 15.3 ක් ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර 2018 වසරේදී ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා සැලකිය යුතු මුදලක් වෙන් කරන බවට ආයතනයට බලාපොරොත්තු විය.

## සමාප්තිය

වැවිලි ක්ෂේත්‍රය සඳහා මූලිකත්වය දරන අධ්‍යාපන ආයතනයක් වශයෙන් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය ක්ෂේත්‍රයේ වර්තමාන උපනතීන් එකමුසු කර ක්‍රමිකව ආයතනයේ නිෂ්පාදිතයන් අද අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි වැඩි දියුණු කරමින් පවතී.

2016 වසර සමග සැසඳීමේදී භෞතික හා මූල්‍යමය වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ආයතනය යම් ප්‍රගතියක් ලබා ගෙන ඇත. පසුගිය වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී තේ, රබර් වැනි වැවිලි ක්ෂේත්‍රයන්ගේ මිල අඩුවීම මත භෞතික වශයෙන් කුඩා වතු ක්ෂේත්‍රයේ වැඩ සටහන් ප්‍රමාණයේ යම් අඩුවීමක් දක්නට ලැබුණද සේවක සංඛ්‍යාවෙහි ධාරිතාවය වර්ධනය වීම මත ඉදිරි වර්ෂයන්හිදී වතු ක්ෂේත්‍රයේ හා කුඩා වතු ක්ෂේත්‍රයේ සේවකයින් සඳහා වැඩි වැඩ සටහන් ප්‍රමාණයක් කිරීමේ හැකියාව ආයතනය සතුව පවතී.

2017 වසරේ ආදායම හා වියදම අතර රුː මිලියන 8.276 ක අතිරික්තයක් පෙන්නුම් කරන අතර 2016 වසරේ රුː මිලියන 203.88 ක් වූ ශුද්ධ වත්කම් අගය 2017 වර්ෂයේදී රුː මිලියන 232.812 දක්වා වර්ධනය විය. තවද ආයතනයේ ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් වැවිලි ක්ෂේත්‍රයේ කුසලතා වර්ධනයට අත්‍යවශ්‍ය ජාතික නිපුණතා සහතිකය ලබා දීමට හැකි වන පරිදි සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකිවිය. ආයතනය කුඩා වතු වැඩ සටහන් 228 සහ පාසැල් හැර ගිය වූවන් සඳහා NVQ 4 මට්ටමේ වැඩ සටහන් දෙකක් රුː මිලියන 10.012 ක් වන භාණ්ඩාගාර ප්‍රතිපාදන වැය කරමින් සිදු කරන ලදී. ඊලග වර්ෂයේදීද ආයතනය කුඩා වතු ක්ෂේත්‍රයට සහ වතු ක්ෂේත්‍රයේ සේවකයින් සඳහා වඩාත් වැඩ සටහන් කිරීම වෙනුවෙන් කටයුතු කිරීම වෙනුවෙන් කටයුතු කිරීමට අවධානය කර ඇත. මෙම තොරතුරු පදනම්ව සමාලෝචිත වසරේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත්විය හැකි අතර 2018 වසරේ ඉලක්ක ලගා කර ගැනීම සඳහා සැලසුම් කිරීමට සේවක මණ්ඩලය විසින් පාලක මණ්ඩලයේ හා අමාත්‍යාංශයේ උපදෙස් මත මහත් පරිශ්‍රමයක් යොදනු ඇත.

ආයතනයේ සභාපති වශයෙන් පාලක මණ්ඩලය හා කළමනාකරණය වෙනුවෙන් 2017 වසර ඉලක්ක ලගා කර ගැනීම වෙනුවෙන් සහයෝගය ලබා දුන් සියළු පාර්ශවයන් සඳහා ස්තුතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නෙමි.



**දීප්ති අශෝක අබේවික්‍රම**

**සභාපති**

**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය**

**15/05/2018**

2017

# මූල්‍ය වාර්තා

# පටුන


| මූල්‍ය වාර්තා | පිටුව |
| --- | --- |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් | 01 - 10 |
| මූල්‍ය තත්ව ප්‍රකාශනය | 11 - 12 |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය | 13 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 14 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 15 - 16 |
| අයවැය සහ සත්‍ය කාර්ය සාධනය | 17 |
| දේපල පිරියත හා උපකරණ ලේඛණය | 18 |
| අස්පෘශ්‍ය වත්කම් ලේඛණය | 19 |
| සටහන් හා උපලේඛණ | 20 - 33 |
| බණ්ධන වාර්තාව | 34 |
| මූල්‍ය උපනතීන් | 35 |
| විගණකාධිපති වාර්තාව | 37 - 43 |

# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

## 2017 මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්

### 01. වාර්තාකරණ අස්ථිත්වය

1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ පනත යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සංස්ථාපනය කරන ලද මෙම ආයතනය 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 සංශෝධනයන් මගින් වඩාත් ඵලදායී ශක්තිමත් රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සවිබල ගන්වා ඇත.

සුදුසුකම්ලත් වැවිලි විධායකයින් වෙත වෘත්තීය සාමාජිකත්වය ලබා දීම හා ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලාවන් සාර්ථකව නිම කරන අයවළුන් සඳහා සහතික පිරිනැමීමට බලයලත් එකම ආයතනය ලෙස මෙම පනත් හා සංශෝධනයන් මගින් බල ගන්වා ඇත. මෙම ආයතනය තේ, රබර්, පොල්, උක්, කජු, කුරුඳු සහ තල් වැනි වැවිලි ක්ෂේත්‍රයේ කුඩා වතු හිමියන් ඇතුළුව එම වැවිලි ක්ෂේත්‍රයේ සේවයේ නියුක්තවූවන්ගේ වෘත්තීය නිපුණතාවය උසස් මට්ටමින් පවත්වා ගෙන යාම පිළිබඳව සහතික වන අතර ඒ වෙනුවෙන් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විවිධ වැඩමුළු, දේශණ හා විභාගයන් පැවැත්වීම හා පර්යේෂණ සිදු කිරීම හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනයන් වෙත උපදේශණ සේවා ලබා දීම සිදු කරනු ලැබේ. ආයතනය දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල සමග සාමූහිකව වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලා පැවැත්වීමද සිදු කරන අතර විදේශීය සිසුන් සඳහා පාඨමාලා පැවැත්වීම සඳහා හැකියාව පවතී.

ආයතනයේ ලියාපදිංචි කාර්යාලය එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

### 2.0 පිළියෙල කිරීමේ පදනම

### 2.1 <u>අනුකූලතා ප්‍රකාශය</u>

ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය විසින් ප්‍රකාශිත ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව උපචිත පදනම මත මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය වාර්තාවෙහි මූල්‍ය තත්ව ප්‍රකාශය, කාර්ය සාධන වාර්තාව, ශුද්ධ වත්කම් විචලනය පිළිබඳ වාර්තාව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ අයවැය හා සත්‍ය කාර්ය සාධන වාර්තාව සමග වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ඇතුලත් කර ඇත.

### 2.2 ඇගයීමේ පදනම

මූල්‍යය ප්‍රකාශනයන් පහත සඳහන් වැදගත් අයිතම හැරුණු විට ඓතිහාසික පරිවර්තන පිරිවැය පදනමට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

- ප්‍රත්‍යාගණන පදනම යටතේ වාහන අගයන් ඉදිරිපත් කරනු ඇත.

- 2014 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත සඳහා පළමු වරට අනුගත කිරීම අනාවරණය කරනු පිණිස දේපල උපකරණ හා පිරියත ප්‍රත්‍යාගණනය කර හෙලිදරව් කර ඇත. පසු කාලීනව වාර්ෂික වාර්තාකරණ කාලය සඳහා පිරිවැය ආකෘතිය බල පැවැත්වේ. 2014.12.31 දින බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ දේපල නැවත ප්‍රත්‍යාගණනය කරන ලද අතර, 2015 සිට ප්‍රත්‍යාගණන අගය මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර ඇත.

- සේවක විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් ආයු ගණක පදනම මත අගය කර ඇත.

2.3 මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් මගින් ප්‍රකාශිත අගයන් පෙන්නුම් කර ඇත.

## 03. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

අවිච්ඡින්න පැවැත්මේ සංකල්පය මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අතර, අඛණ්ඩව කාල සීමාව පුරා මෙම සංකල්පය අදාල වේ. රාජ්‍ය ප්‍රදාන මගින් හා පුහුණු වැඩ සටහන්, අධ්‍යාපන වැඩ සටහන්, උපදේශන සේවා භාර ගැනීම, වාර්ෂික සාමාජික දායක මුදල් හා ප්‍රකාශන අලෙවිය තුළින් අරමුදල් සම්පාදනය කර ගනු ලැබේ. මෙමගින් රැස් කරන අරමුදල් ආයතනයේ අවශ්‍යතාවය පරිදි වගකීම් පියවීම හැකි පරිදි උපයෝගී කර ගනු ලැබේ.

## 3.1 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට සමුච්චිත ක්‍රමක්ෂය හා අපහායන අඩු කර වාර්තා කරනු ලැබේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සැලකිල්ලට ගෙන සරල මාර්ග ක්‍රමය උපයෝගී කර ගෙන අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කරනු ලැබේ. ඇස්තමේන්තුගත ජීවිත කාලය වාර්ෂිකව වාර්තා කරන කාල සීමාවන්හි විමර්ෂණයට භාජනය කරන අතර එහි කිසියම් වෙනසක් වේ නම් පිරික්සුම් අගය පදනම්ව ගිණුම් ගත කරනු ලැබේ.

- **පරිගණක මෘදුකාංග**

  ආයතනය විසින් සංවර්ධිත ගිණුම්කරණ මෘදුකාංගය, වැටුප් පිළියෙල කිරීමේ මෘදුකාංග, පුහුණු දත්තයන් සහ සම්පත් කළමනාකරණ මෘදුකාංගයන් පරිගණකයෙහි මෙහෙයුම් පද්ධතියක කොටසක් නොවන අතර, අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගෙන ඇත. මෙම වත්කම් වසර 4 ක් පුරා ගිණුම් පොත් වලින් ලියා හැරීම සිදු කරනු ඇත.

- **දුරස්ථ අධ්‍යාපන විෂය මාලා සංවර්ධනය**

  දුරස්ථ අධ්‍යාපන විෂය මාලා සංවර්ධනය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගෙන ඇති අතර, සංවර්ධිත විෂයමාලා සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය වසර 4 ක් ලෙස සැලකිල්ලට ගෙන ඇත.

- **ජාතික වෘත්තීය නිපුණතා මට්ටම දක්වා විෂය මාලා සංවර්ධනය කිරීමට වැය වන පිරිවැය**

  ආයතනය විසින් එහි පාඨමාලා ජාතික වෘත්තීය නිපුණතා සහතිකය ලබා ගැනීමට හැකි පරිදි සංවර්ධනය කරන අතර සංවර්ධිත පිරිවැය අස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකිල්ලට ගනු ලැබේ. එම පිරිවැය වසර 4 කින් මූල්‍ය වාර්තා වලින් ලියා හැරීමට කටයුතු කර ඇත.

  අස්පෘශ්‍ය වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීව කාලය පහත සඳහන් පරිදි ඇස්තමේන්තු ගත කර ඇත.

| විස්තරය | පරිගණක මෘදුකාංග | දුරස්ථ අධ්‍යාපන පාඨමාලා සංවර්ධන පිරිවැය | NVQ පාඨමාලා සංවර්ධන පිරිවැය |
|---|---|---|---|
| **ප්‍රයෝජනවත් ජීව කාලය** | වසර 04 | වසර 04 | වසර 04 |

## 3.2 කුඩා වතු හිමියන් සහ පාසැල් හැර ගිය සිසුන් සඳහා ධාරිතා වර්ධන වැඩ සටහන්

කුඩා වතු හිමියන් සඳහා පවත්වන ධාරිතා සංවර්ධන වැඩ සටහන් ආයතනයේ ප්‍රාග්ධන සංවර්ධන පිරිවැයක් ලෙස සලකනු ලැබේ. ඒ මගින් ඔහුන්ගේ දැනුම වර්ධනය වීමට හේතු පාදක වී ඇති අතර, කුඩා වතු හිමියන්ගේ හැකියාවන් වර්ධනය වී ඇත. අවසාන පාරිභෝගිකයාගේ දෑතට ගුණාත්වයෙන් ඉහල නිෂ්පාදනයන් ලබා දීම පෙරදැරිව කුඩා වතු හිමියන්ගේ කෘෂිකාර්මික දැනුම අපේක්ෂිත මට්ටමට සංවර්ධනය සඳහා කඩිනම් අවශ්‍යතාවයක් සේ සලකා මෙම වැඩ සටහන් සංවිධානය කරන අතර එය ආයතනයේ කීර්තිනාමය ඉහල යාමටද හේතු පාදක වේ.

මෙම වැඩ සටහන් වලට අමරතව වැවිලි ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තු වන පාසැල් හැර ගියවූවන් සඳහා NVQ සහතිකය ලබා ගැනීමට හැකි පරිදි ඔවුන්ගේ කුසලතා වැඩි කිරීම වෙනුවෙන්ද ආයතනය විසින් පාඨමාලා සංවිධානය කරනු ලබයි.

කුඩා වතු හිමියන්ගේ කළමනාකරණ දැනුම වර්ධනය කිරීම හා ඔවුන්ගේ ආදායම් වැඩි වීම කෙරෙහි බලපානු ලැබේ. මෙම වැඩසටහන්හි ප්‍රතිඵල වර්ෂය තුළදී උපලබ්ධි වන බවට උපකල්පනය කරන අතර, එම නිසා ආයෝජිත අගය එම වර්ෂයේදීම ලියා හරිනු ලැබේ. 2017 වසරේ ජාතික අයවැය මගින් රුː මිලියන 10.012 ක් මුදලක් වැය කර කුඩා වතු හිමියන්ගේ සහ කම්කරුවන්ගේ දැනුම වර්ධනය කිරීමේ වැඩ සටහන් 231 ක් පවත්වා ඇති අතර, පාසැල් හැර ගිය සිසුන් සඳහා NVQ පාඨමාලා 02 ක් සංවිධානය කර තිබුණි.

## 3.3 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ඓතිහාසික පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කර පෙන්නුම් කර ඇත. වත්කම ක්‍රියාකාරී තත්වයට පත් කරන තුරු වූ සෘජු පිරිවැයක් මෙන්ම සැලකිය යුතු මට්ටමේ අළුත්වැඩියාවන් මෙම ඓතිහාසික පිරිවැයෙහි අන්තර්ගත කර ඇත.

දේපල පිරියත හා උපකරණයන්ගේ එක් එක් අයිතමයන් ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි  වෙනස්කම් මත ඒවා වෙන් වශයෙන් ජීවිත කාලය අනුව ක්ෂය ගණනය කිරීම සිදු කෙරෙනු ලැබේ.

### 3.3.1 ප්‍රයෝජනවත් ජීව කාලය

සරල මාර්ග ක්‍රමය පදනම්ව ක්ෂය ගණනය කරනු ලබන අතර, ගිණුම් සඳහා ක්ෂය ඇස්තමේන්තුගත කරනු ලබන්නේ වත්කමේ ජීවිත කාලය සැලකිල්ලට ගෙන පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කිරීම මඟිනි.

ප්‍රවර්තන හා පෙර වර්ෂ සඳහා අදාල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ උපයෝගී කර ගත් ක්ෂය අනුපාතයන් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| **නිදහස් ගොඩනැගිලි** | අවු. 20 | 5% |
| **කාර්යාලීය ලී බඩු** | අවු. 10 | 10% |
| **මෝටර් වාහන** | අවු. 5 | 20% |
| **මාර්ග පද්ධති, ජල සැපයුම්, විදුලිය හා දුරකථන, (යටිතල වත්කම්)** | අවු. 10 | 10% |
| **පුස්තකාල පොත්** | අවු. 10 | 10% |

**<u>ව්‍යතිරේඛයන්</u>**

- උපකරණ තුළ යන්ත්‍ර සූත්‍ර, කාර්යාලීය උපකරණ සහ නේවාසිකාගාර උපකරණ හා තිර රෙදිපිලි ආදී භාණ්ඩ ඇතුලත් වේ. මෙම අයිතම වල ජීව කාලය එකිනෙකට වෙනස් වන අතර එය පහත සඳහන් වේ.

| | |
|---|---|
| යන්ත්‍ර සූත්‍ර | වසර 5 |
| කාර්යාලීය උපකරණ | වසර 5 |
| නේවාසිකාගාර උපකරණ හා තිර රෙදි | වසර 4 |

- පරිගණක ජාල කරණය, යටිතල වත්කම් ලෙස වර්ගීකරණය කර පැවතියද ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු 5 ක් ලෙස සලකනු ලැබේ.

- 150 KVA විදුලි ජනක යන්ත්‍රය හා පිරියත යටතේ වර්ගීකරණය කර ඇති අතර එහි ප්‍රයෝජනවත් ආයු කාලය වසර 10 ක් ලෙස සැලකිල්ලට ගෙන ඇත.

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව යටිතල වත්කම් සඳහා පහත සඳහන් දෑ ඇතුලත් කර ඇත.

- මාර්ග සංවර්ධන වියදම්
- ජල සැපයීමේ හා බල උත්පාදන වියදම්
- විදුලි සැපයීමේ වියදම්
- පරිගණක ජාලකරණය

ක්ෂය කිරීමේ ක්‍රමය ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ අවශේෂ වටිනාකම සෑම මූල්‍ය වර්ෂයකදීම විමර්ශණයට භාජනය කර නියමිත ගැලපිලි අවස්ථානුකූලව සිදු කරනු ලැබේ.

**මිනුම්කරණ පදනම**

ඉඩම් හා වාහන හැර අනෙකුත් සියළුම වත්කම් පිරිවැය පදනම අනුව ක්ෂය කරන අතර වාහන ප්‍රත්‍යාගනන පදනම මත ක්ෂය කිරීම සිදු කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු කරනු නොලැබේ.

### 3.3.2 අපහරණය කිරීම

දේපල පිරියත උපකරණයන්හි අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති විට හෝ අපහායනයෙන් භාවිතයෙන් ඉවත් කල විට රැගෙන එන වටිනාකම මත හඳුනා ගන්නා අතර පාඩුව හෝ ලාභය ලැබෙන මිල හා රැගෙන එන වටිනාකම සසඳා තීරණය කරනු ලැබේ. මෙමගින් වන ලාභය හෝ පාඩුව කාර්ය සාධන වාර්තාවේ අන්තර්ගත කරනු ලැබේ.

### 3.3.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

ආයතනය වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය පවත්වා ආර්ථිකමය වශයෙන් භාවිතයට ගත නොහැකි ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා නිර්දේශ කරනු ලබයි.

### 3.3.4 ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් අත්පත් කර ගත් ඉඩම් වල වර්තමාන තත්වය

හෙක්ටයාර 1.9499 ක භූමි ප්‍රමාණයක් සහ කාර්ය මණ්ඩල නිල නිවාස 03 ක් ශ්‍රී ලංකා යුධ හමුදාවේ 7 වෙනි රෙජිමේන්තුව විසින් අත්පත් කරගෙන ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ ඉහත සඳහන් දේපල වල හිමිකාරීත්වය අත්පත් කර ගන්නා ලදී. ආයතනයට ලැබිය යුතු වන්දි මුදල රු: මිලියන

55.0 ක් වුවද මෙම ඉඩම ආයතනයට නැවත අත්පත් කර ගැනීම සඳහා ආයතනය නියමිත ක්‍රියාවලිය අනුගමනය කරමින් සිටීම මත මෙම ගණුදෙනු නතර වී ඇත.

## 4.0 යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ඇති තැම්පතු

යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් සේවා සපයන ආයතනයන් ඉදිරිපත් කර ඇති සුරක්ෂිත තැම්පතු මෙයට ඇතුලත්වේ.

## 5.0 තොගයන්

ආයතනයේ ප්‍රකාශන, මුද්‍රණ උපකරණ, ලිපි ද්‍රව්‍ය, කාර්යාල අවශ්‍යතා, ටයර්, ගොඩනැගිලි නඩත්තු උපකරණ සහ වෙනත් පාරිභෝග පරිහරණ ද්‍රව්‍යයන් තොගයේ අන්තර්ගත වේ. තොග ගණනයන් ප්‍රථම නිකුතු ප්‍රථම මිල ක්‍රමය සැලකිල්ලට ගෙන ගණනය කරනු ලැබේ. තේ සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රදානය කල පොත් වල වටිනාකම ප්‍රකාශන තොගයේ ඇතුලත් කර ඇත.

යොදාගත් පිරිවැය සමීකරණය = " ගත්මිල + ගැලපුම් පිරිවැය + අනෙකුත් පිරිවැය "

තොගයන්හි රැගෙන එන වටිනාකම පහත සඳහන් කර ඇත.

| අයිතමය | රැගෙන එන වටිනාකම සාධාරණ අගයට රු: 000 | විකිණීමට පිරිවැය | රැගෙන එන සාධාරණ අගය රු: 000 |
|---|---|---|---|
| **ලිපිද්‍රව්‍ය** | 327 | - | 327 |
| **මුද්‍රණ උපකරණ** | 697 | - | 697 |
| **සුභ සාධන අයිතම** | 41 | - | 41 |
| **පාරිභෝගික අයිතම** | 48 | - | 48 |
| **ගොඩනැගිලි නඩත්තු උපකරණ** | 57 | - | 57 |
| **ටයර් සහ ටියුබ්** | 31 | - | 31 |
| **ප්‍රකාශන** | 370 | - | 370 |
| **එකතුව** | 1573 | - | 1573 |

**ප්‍රදානය කල ප්‍රකාශනයන්**

ප්‍රදානය කරන ලද ප්‍රකාශන පොත් වටිනාකම ප්‍රකාශන තොගයේ ඇතුලත් කර ඇති අතර, ප්‍රදාන වටිනාකම විලම්භිත ආදායම් යටතේ ජංගම වගකීම් වල පෙන්නුම් කර ඇත. ආදායම අදාල වර්ෂය තුලදී උපලබ්ධි වන ආකාරය අනුව ගිණුම් ගත කරනු ලැබේ.

## 6.0 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ සඳහා මුදල් සහ අතුරුගිරිය ලංකා බැංකු ශාඛාවේ ජංගම ගිණුමේ ශේෂයන් ඇතුලත්ය.

## 7.0 මූල්‍ය උපකරණ

ණය හා ලැබිය යුතු දෑ හා තැන්පතු ගණුදෙනුව ඇති වූ අවස්ථාවේදීම ආයතනය මූලික වශයෙන් මූල්‍ය උපකරණයක් ලෙස හඳුනා ගන්නා අතර එම මූල්‍ය වත්කම් පරිනත දිනයේදී මූල්‍ය ප්‍රවාහය තුලට ඇතුලත් කරනු ලැබේ.

**කල් පිරෙන තෙක් තබා ගන්නා මූල්‍ය වත්කම්**

කල් පිරෙන තෙක් තබා ගැනීමේ අරමුණින් මූලිකව හඳුනා ගන්නා ලද මූල්‍ය වත්කම් කල් තබා ගන්නා මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් මූලිකව හඳුනා ගැනීමේදී ධාරණ අගයට සෘජුව බලපාන ගණුදෙනු පිරිවැය එකතු කර අපහායණයන් අඩු කර සඵල පොලී අනුපාත ක්‍රමයට ගණනය කරනු ලබයි.

මෙම මූල්‍ය වත්කම කල් පිරීමට පෙරාතුව විකිණීම සිදු කරනු ලැබීමකදී විකිණීමට ඇති ආයෝජන ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබේ.

**ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොල මිල තිරණය සඳහා ඉදිරිපත් නොවන අතර, එම වත්කම් මුලිකව ධාරණ අගයට සෘජුව සම්බන්ධ ගණුදෙනු පිරිවැය එකතු කර අගය කර ඇත. එසේ ගණනය කිරීමෙන් පසු එම ණය හා ලැබිය යුතු දෑ සඳහා ක්‍රමක්ෂය පිරිවැය මැනීම මත සඵල පොලි අනුපාතයට අනුව ගණනය කර අපහායනය අඩුකර පෙන්නුම් කරනු ලැබේ.

## 8.0 සේවක විශ්‍රාමික ප්‍රතිලාභ

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂිත දීමනා

නිර්වචිත ප්‍රතිලාභ සැලසුමට අමතරව පසු සේවක ප්‍රතිලාභයන් සඳහා සැලසුම් කර ඇත. ආයතනයේ නිර්වචිත පාරිතෝෂිත දීමනා අගය සඳහා ශුද්ධ වගකීම වාර්ෂික ආයුගත ඒකක අගය Projected unit rate යටතේ ගණනය කර පෙන්වනු ලැබේ. ආයතනයේ සියළුම සේවකයින් සඳහා ඔවුන්ගේ විශ්‍රාමික පාරිතෝෂිත දීමනා ඔවුන් සේවයෙන් විශ්‍රාම ගැනෙන අවස්ථාව දක්වා ආවරණය වන පරිදි සැලසුම වෙත වෙන් කර පිරිවැය කාර්ය

සාධන ප්‍රකාශයේ ඇතුලත් කර ඇත. ආයුගණක කිරීමෙන් පසු ලාභය හෝ පාඩුව ආදායමක් හෝ වියදමක් ලෙස වාර්තාකරන වර්ෂයේදීම හඳුනා ගැනේ.

වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල පාරිතෝෂිත දීමනා ජංගම වගකීම් යටතේ පෙන්නුම් කරනු ලැබේ. මුළු පාරිභෝගික දීමනා ප්‍රමාණය හා සමාන අගයක් ලංකා බැංකුවේ තැන්පතු ගිණුම් වල ගෙවීම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ආයෝජනය කර ඇත.

නිර්වචිත දායක සැලසුම - සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

නිර්වචිත දායක සැලසුම යටතේ ආයතනය ස්ථාවර දායක මුදලක් සියළු සේවකයින් සඳහා ගොනු ලැබේ. මූලික වැටුපට හා ජීවන වියදම් දීමනා අගයන්හි එකතුව මෙම ගණනය සඳහා උපයෝගී කර ගන්නා අතර ආයතනය විසින් 12% EPF සඳහාද 3% ක් ETF සඳහාද දායකත්වය සලසයි.

## 9.0 ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ට අනුව ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කරන අතර ඒ අනුව 2016 සිට මූල්‍ය ප්‍රකාශන සඳහා අනුගත කර ඇත. මෙම ප්‍රමිතයට අනුව ප්‍රාග්ධන ප්‍රදානයන් ආයතනයේ ආදායමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලැබේ

## 10.0 කෙටි කාලීන වෙන් කිරීම් සහ අසම්භාව්‍යන්

## 10.1 අසම්භාව්‍ය වගකීම්

ශ්‍රව්‍ය දෘෂ්‍ය නිළධාරී ලෙස ආයතනයේ සේවය කල ඒ. සී. කේ. අත්තනගොඩ මහතා විසින් විනය කරුණු හේතු කොට ගෙන ඔහුව සේවයෙන් පහ කිරීම පිළිබඳව නීතිමය පියවර ගෙන ඇත. මෙම හේතුවෙන් වර්ෂය සඳහා රු. 708,378/- ක්වූ අසම්භාව්‍ය වගකීමක් ඔහුගේ වැටුප්, වේතන හා අනෙකුත් ගෙවීම් වෙනුවෙන් අනාවරණය කිරීම වෙනුවෙන් වෙන් කිරීමක් සිදු කර ඇත. මේ වන විට මෙම නඩුව කම්කරු උසාවියේ විමර්ෂණය වෙමින් පවතී. 2015 වසර අවසාන වන විට වෙන් කර ඇති අසම්භාව්‍ය වගකීම රු. 3,765,756/-කි.

ඇති විය හැකි අනාගත වගකීම් හෝ වර්තමාන වගකීම් පිළිබඳව මුදල් ගලා යාමේ ප්‍රවාහයන් හදුනා ගැනීමේ අපහසුව හේතුවෙන් 2016 සහ 2017 වසර සදහා ආයතනය කිසිදු වෙන් කිරීමක් සිදු කර නොමැත.

## 10.2 අඩමාන ණය සඳහා වෙන් කිරීම

වර්ෂය අවසාන වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය මත 6% ක අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර සටහන් අංක 48 මගින් මූල්‍ය අවධානම පිළිබඳ අතිරේක තොරතුරු ණය අත්තිකාරම් සහ අනෙකුත් කාලීන තැන්පතු සමග ඉදිරිපත් කර ඇත.

## 11.0 ආදායම් හඳුනා ගැනීම

***පුහුණු ආදායම***

### 11.1 කෙටි කාලීන වැඩ සටහන්

පුහුණු කාල සීමාව මාස 06 කට වඩා අඩු නම් එම වැඩ සටහන කෙටි කාලීන වැඩ සටහනක් ලෙස වාර්තා කරන අතර පුහුණු වැඩ සටහන ආරම්භක වර්ෂයේදීම මෙහි මුළු ආදායම හා වියදම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

### 11.2 දිගු කාලීන පුහුණු වැඩ සටහන් (ඉදිරියට යන වැඩ සටහන්)

පුහුණු කාල සීමාව මාස 06 ට වඩා වැඩි වන්නේ නම් එම වැඩ සටහන් දිගු කාලීන වැඩ සටහන් (ඉදිරියට යන වැඩ සටහන්) ලෙස සලකනු ලැබේ. මෙහි පුහුණු වැඩ සටහන් වල ආරම්භක මාසය හා පාඨමාලා කාල සීමාව සැලකිල්ලට ගෙන සමානුපාතික පදනම උපයෝගී කර ගෙන ආදායම් හා වියදම් කාලීන පදනම මත ගිණුම් ගත කෙරේ.

### 11.3 බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය

බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් සහ වියදම වෙන වෙනම මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්නුම් කර ඇත. 2017 වර්ෂයේ ශුද්ධ ඌණතාවය රු: 580,962/- ක් ලෙස වාර්තා වී ඇත.

### 11.4 වෙනත් ආයතන වෙත පහසුකම් කුලියට ලබා දීම.

ආයතනය ආදායම් ඉපයීම සඳහා එහි පහසුකම් වෙනත් ආයතන වෙත කුලී පදනමින් ලබා දෙනු ලැබේ. ආයතනයේ ප්‍රමුඛ පරමාර්ථයට පරිබාහිරව වෙනත් ව්‍යාපෘතියක් හේතුවෙන් මෙහි ආදායම් හා වියදම් වෙන වෙනම මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ වාර්තා කරනු ලැබේ.

### 11..5 රජයේ ප්‍රදාන

ජාතික අයවැය දෙපාර්තමේන්තුව වාර්ෂික අයවැය මගින් සැලකිය යුතු මුදලක් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වෙනුවෙන් ප්‍රදානය කරන අතර, එම ප්‍රදානයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 ට අනුව ගිණුම් ගත කර ඇත.

## 12.0 වාර්තාකරණ දිනට පසු සිදුවන සිදු වීම

මූල්‍ය වාර්තා නිකුත් කිරීමට  අනුමත කරන දිනය හා වාර්තා කරන අවසාන දිනය අතරතුර සිදුවන හිතකර හා අහිතකර  සිදුවීම් වාර්තාකරණ දිනයට පසු සිදුවීම් ලෙස ගනු ලැබේ. සිදුවන සිදුවීමේ වටිනාකමේ ස්වභාවය

මත මෙම සිදුවීම් හෙළිදරව් කල යුතු හෝ ගැලපිය යුතු කරුණු ලෙස අවශ්‍ය ආකාරයට මූල්‍ය වාර්තා වල වාර්තා කරනු ලැබේ.

**ගැලපීය යුතු අවස්ථා**

මූල්‍ය තත්වය ප්‍රකාශනයේ ගැලපිය යුතු සිදුවීමක් සිදු නොවූ හේතුවෙන් ගැලපිලි සටහනක  අවශ්‍යතාවයක් පැන නොනැගිනි.

**හෙළිදරව් කල යුතු අවස්ථා**

- **ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් අත්පත් කර ගන්නා ලද ඉඩමේ තත්වය**

ශ්‍රී ලංකා යුධ හමුදාවේ 7වන ඉංජිනේරු ස්වෙච්චා රෙජිමේතුව මගින් ඉඩම් හෙක්ටයාර 1.9499 ක් හා කාර්ය මණ්ඩල නිල නිවාස 03 ක් පවරා ගෙන ඇත. වත්කමේ අයිතිය ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව 38 (අ) ඔවුන් වෙත පවරා ගෙන ඇත. මේ වෙනුවෙන් රුः මිලියන 55 ක මුදලක් වන්දි වශයෙන් ආයතනය වෙත ලැබීමට නියමිතය.

- **නව සංවර්ධන ව්‍යාපෘතිය**

ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් රුः මිලියන 314.0 ක් වූ ආයතනය උපාධි පිරිනැමීමේ ආයතනයක් දක්වා සංවර්ධනය කරනු ලබන ව්‍යාපෘතියක් සඳහා නිර්දේශය ලබා දී ඇති අතර එහි මුල් අදියරේ වැඩ 2017 වර්ෂයේදී ආරම්භ කර ඇත.

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**මුල්‍ය තත්ව ප්‍රකාශනය රුපි.**

දෙසැම්බර් 31 දිනට

| **වත්කම්** | **සටහන්** | 2017 | 2016 |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 13 | 8,322,092.15 | 9,429,122.50 |
| ලැබිය යුතු දෑ | 14 | 6,512,657.73 | 6,406,142.67 |
| තොගයන් | 15 | 1,573,072.96 | 1,110,640.27 |
| කලින් ගෙවීම් | 16 | 3,277,962.77 | 2,174,165.11 |
| වෙනත් ජංගම වත්කම් | 17 | 17,027,324.05 | 16,136,788.77 |
| | | **36,713,109.66** | **35,256,859.32** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ලැබිය යුතු දෑ | 18 | 1,422,443.34 | 1,308,730.19 |
| දේපල, පිරියත හා උපකරණ | 19 | 223,701,258.60 | 190,082,148.84 |
| අස්පෘශ්‍ය වත්කම් | 20 | 1,022,076.79 | 1,590,188.79 |
| ජංගම නොවන වෙනත් වත්කම් | 21 | 611,975.00 | 611,975.00 |
| | | **226,757,753.73** | **193,593,042.82** |
| | | | |
| **මුළු වත්කම්** | | **263,470,863.39** | **228,849,902.14** |
| | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | 22 | 19,464,317.04 | 13,511,832.17 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 23 | 3,765,756.60 | 3,765,756.60 |
| සේවක ප්‍රතිලාභ | 24 | - | - |
| | | **23,230,073.64** | **17,277,588.77** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත රාජ්‍ය ප්‍රදාන | 25 | - | - |
| සේවක ප්‍රතිලාභ | 26 | 7,313,626.00 | 7,581,312.24 |
| ආපසු ගෙවන ආරක්ෂිත තැන්පතු | 27 | 114,637.87 | 110,649.71 |
| | | **7,428,263.87** | **7,691,961.95** |
| **මුළු වගකීම්** | | **30,658,337.51** | **24,969,550.72** |
| | | | |
| **ශුද්ධ වත්කම්** | | **232,812,525.88** | **203,880,351.42** |
| | | | |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| **රජය දායක වූ ප්‍රාග්ධනය හා වෙනත් රාජ්‍ය අස්ථිත්වයන්ගේ දායකත්වය** | 28 | 35,490,371.21 | 38,386,495.21 |
| **සංචිතයන්** | 29 | 135,710,198.08 | 113,728,054.19 |
| **සමුච්චිත අතිරික්තය / (ඌණතාවය)** | 30 | 61,611,956.59 | 51,765,802.02 |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | **232,812,525.88** | **203,880,351.42** |

පිටු අංක 1 -10 දක්වා සහ 13 සිට 35 සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංඝටනීය කොටසක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇති බවට සහතික වෙමි.

**එල්. ඩී. ජේ. ප්‍රියන්ත**
**ගණකාධිකාරී**

මෙම ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටින අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ආචාර්ය ප්‍රසාද් ධර්මසේන**
**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**
2018.02.28

**දීප්ති අශෝක අබේවික්‍රම**
**සභාපති**

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| ආදායම | සටහන් | 2017 රු: | 2016 රු: |
|---|---|---|---|
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 31 | 40,000,000.00 | 38,961,000.00 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ආදායම | 32 | 19,874,000.00 | 32,689,000.00 |
| විශේෂ ව්‍යාෘතියෙන් ලද ආදායම - වැව්ලි කර්මාන්ත අමාත්‍යාශය | 33 | 15,300,000.00 | - |
| පුහුණු ආදායම් | 34 | 15,853,414.62 | 12,787,802.17 |
| නේවාසික පහසුකම් කුලියට දීම තුලින් ලද ආදායම් | 35 | 10,983,170.45 | 9,397,569.33 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් | 36 | 1,896,323.90 | 4,835,304.57 |
| පොලී ආදායම් | 37 | 2,115,931.09 | 992,211.13 |
| වෙනත් ආදායම් | 38 | 9,372,943.62 | 2,165,320.96 |
| **මුළු ආදායම** | | **115,395,783.68** | **101,828,298.16** |
| | | | |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 39 | 38,796,942.45 | 32,571,649.40 |
| සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය භාවිතය | 40 | 3,690,033.86 | 3,008,488.36 |
| නඩත්තු සහ අළුත්වැඩියා | 41 | 5,058,616.60 | 4,032,431.91 |
| සන්නිවේදන සහ උපයෝගීතා සේවා | 42 | 11,388,958.28 | 8,547,744.86 |
| පුහුණු වියදම් ධාරිතා පුහුණු වැඩසටහන් ද ඇතුළුව | 43 | 20,135,784.88 | 14,326,920.45 |
| නේවාසික පහසුකම් කුලියට දීම සඳහා වු වියදම් | 44 | 3,488,241.76 | 2,561,429.35 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම් | 45 | 2,516,813.45 | 2,465,732.03 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 46 | 20,533,532.72 | 18,951,476.64 |
| වෙනත් වියදම් | 47 | 1,510,422.78 | 604,814.08 |
| **මුළු වියදම්** | | **107,119,346.78** | **87,070,687.08** |
| කාල සීමාවට අදාල අතිරික්තය / (ඌනතාවය) | | 8,276,436.90 | 14,757,611.08 |
| **පාලන අස්තිවෙයේ හිමිකාරීත්වයට අදාල කොටස** | | **8,276,436.90** | **14,757,611.08** |

## ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය

## ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

*දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා*

**ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

| විස්තරය | දායක වූ ප්‍රාග්ධන | ප්‍රත්‍යාගණන සංචිතය | රඳවා ගත් සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය) | මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය |
|---|---|---|---|---|
| **2014 ජනවාරි 01 දිනට ශේෂය** | **38,386,495.21** | **10,584,233.03** | **(24,351,329.70)** | **24,619,398.54** |
| 2014 ප්‍රත්‍යාගණන ලාභය - නැවත ප්‍රකාශිත | - | 99,539,399.11 | - | 99,539,399.11 |
| 2014 වසර සඳහා අතිරික්තය / (හිඟය)- නැවත ප්‍රකාශිත | - | - | (1,833,578.71) | (1,833,578.71) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386,495.21** | **110,123,632.14** | **(26,184,908.41)** | **122,325,218.94** |
| | | | | |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රත්‍යාගණන ලාභය | - | 3,604,422.05 | - | 3,604,422.05 |
| 2015 වසරේ වාර්ෂික අතිරික්තය | - | - | 632,438.02 | 632,438.02 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386,495.21** | **113,728,054.19** | **(25,552,470.39)** | **126,562,079.01** |
| 2015.12.31 දිනට විලම්බිත ආදායම් ගිණුමේ ශේෂය රඳවාගත් ලාභ ගිණුමට මාරු කිරීම. | - | - | 62,560,661.33 | 62,560,661.33 |
| 2016 වසර සඳහා අතිරික්තය | - | - | 14,757,611.08 | 14,757,611.08 |
| | | | | |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386,495.21** | **113,728,054.19** | **51,765,802.02** | **203,880,351.42** |
| ප්‍රත්‍යාගණන ලාභ රඳවා ගත් ලාභ ගිණුමට මාරු කිරීම | | (1,569,717.67) | 1,569,717.67 | - |
| **ප්‍රත්‍යාගණන අතිරික්තය 2017** | - | 23,551,861.56 | - | 23,551,861.56 |
| **රාජ්‍ය භාණ්ඩාගාරය වෙත මාරු කිරීම** | (2,896,124.00) | - | - | (2,896,124.00) |
| **2017 වර්ෂය සඳහා ලාභය** | - | - | 8,276,436.90 | 8,276,436.90 |
| **2017.12.31 දිනට ශේෂය** | **35,490,371.21** | **135,710,198.08** | **61,611,956.59** | **232,812,525.88** |

| ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය<br>මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | |
|---|---|---|
| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් සිදු වු මුදල් ප්‍රවාහයන්** | 31/12/2017 | 31/12/2016 |
| | රු: | රු: |
| **වර්ෂය සඳහා අතිරික්තය (හිඟය)** | 8,276,436.90 | 14,757,611.08 |
| **අඩු කලා පොලී ආදායම** | 1,900,656.95 | 1,444,824.09 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වු ශුද්ධ මුදල් ප්‍රවාහය** | 6,375,779.95 | 13,312,786.99 |
| ***මුදල් නොවන සංචලනයන්*** | | |
| ක්ෂය | 19,965,420.72 | 18,512,040.64 |
| ක්‍රමක්ෂය | 568,112.00 | 439,436.00 |
| විශ්‍රාමික පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | (267,686.24) | (2,228,616.76) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභ / අලාභ | (2,682,075.47) | 78,522.92 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන් | (35,174,000.00) | (32,689,000.00) |
| අඩමාණ ණය අධි වෙන් කිරීම | (46,612.76) | 200,399.00 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම්) / අඩුවීම් | 231,637.31 | 602,036.66 |
| තොගයන්හි (වැඩිවීම්) / අඩුවීම් | (462,432.69) | 376,274.69 |
| කලින් ගෙවුම් හි (වැඩිවීම්) / අඩුවීම් | (1,103,797.66) | (1,824,024.71) |
| අනෙකුත් ජංගම වත්කම් හි (වැඩිවීම්) / අඩුවීම් | 955,468.49 | 4,381,936.15 |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි වැඩිවීම් / (අඩුවීම්) | 5,952,484.87 | (5,413,806.95) |
| මූල්‍යමය උපකරණ වල ක්‍රමක්ෂය ලාභ/අලාභ | (215,274.14) | 452,612.96 |
| සේවක රක්ෂිත තැන්පතු වැඩිවීම් / (අඩුවීම්) | 3,988.16 | (9,273.89) |
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වු ශුද්ධ මුදල් ප්‍රවාහය*** | **(5,898,987.46)** | **(3,808,676.30)** |
| ***ආයෝජන ක්‍රියාකාරකම්*** | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | (30,426,308.45) | (32,050,477.26) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | (779,243.00) |

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 3,075,715.00 | 133,488.00 |
| කෙටි කාලින තැන්පතු වල ආයෝජනය කිරීම | (1,135,475.77) | (866,270.60) |
| තැන්පතු මුදල් බවට පත් කිරීම | - | - |
| ණය අත්තිකාරම් ගෙවීම | (2,958,470.00) | (1,976,280.00) |
| ණය හා අත්තිකාරම් ලැබීම් | 2,529,143.67 | 1,982,199.64 |
| පොලී ආදායම් ලැබීම් | 1,429,476.65 | 943,118.88 |
| ***ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය*** | **(27,485,918.90)** | **(32,613,464.34)** |
| ***මුල්‍ය ක්‍රියාකාරකම්*** | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන් | 19,874,000.00 | 32,689,000.00 |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රදායන් | 15,300,000.00 | - |
| මහා භාණ්ඩාගාරය වෙත කල ගෙවීම් | (2,896,124.00) | - |
| ***මුල්‍යමය ක්‍රියාකාරකම් වලින් වූ ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය*** | **32,277,876.00** | **32,689,000.00** |
| | | |
| ***මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)*** | **(1,107,030.36)** | **(3,733,140.64)** |
| | | |
| ***මුදල් හා මුදල් සමාන දෑ හී වර්ෂ ආරම්භක ශේෂය*** | **9,429,122.51** | **13,162,263.14** |
| | | |
| ***මුදල් හා මුදල් සමාන දෑ හී වර්ෂ අවසාන ශේෂය සටහන් 13*** | **8,322,092.15** | **9,429,122.50** |

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**අයවැය සහ සත්‍ය කාර්ය සාධනය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 000

| *ආදායම* | | *සත්‍ය* | *අයවැය* | *ප්‍රගතිය* |
|---|---|---|---|---|
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 31 | 40,000 | 40,000 | 100% |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ආදායම | 32 | 19,874 | 30,000 | 66% |
| අමාත්‍යාංශ ව්‍යාපෘති අරමුදල | 33 | 15,300 | 15,300 | 100% |
| පුහුණු ආදායම් | 34 | 15,853 | 24,708 | 64% |
| නේවාසික පහසුකම් කුලියට දීම | 35 | 10,983 | 10,475 | 105% |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් | 36 | 1,896 | 5,000 | 38% |
| පොලී ආදායම් | 37 | 2,116 | 1,200 | 176% |
| වෙනත් ආදායම් | 38 | **9,373** | 867 | 108% |
| ***මුළු ආදායම්*** | | **115,396** | **127,550** | **90%** |
| | | | | |
| ***පුනරාවර්තන වියදම්*** | | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 39 | 38,797 | 41,424 | 94% |
| සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය භාවිතයන් | 40 | 3,690 | 5,286 | 70% |
| නඩත්තු සහ අලුත්වැඩියා | 41 | 5,059 | 4,600 | 110% |
| සන්නිවේදන සහ උපයෝගීතා සේවා | 42 | 11,389 | 14,870 | 77% |
| පුහුණු වියදම් | 43 | 20,136 | 20,250 | 99% |
| පහසුකම් කුලියට දීම සම්බන්ධ වියදම් | 44 | 3,488 | 3,000 | 116% |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම් | 45 | 2,517 | 3,000 | 84% |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 46 | 20,534 | 18,500 | 111% |
| වෙනත් වියදම් | 47 | 1,510 | 1,320 | 114% |
| **මුළු වියදම්** | | **107,119** | **112,250** | **95%** |
| | | | | |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| දේපල පිරියත හා උපකරණ | | 18,289 | 18,500 | 99% |
| ධාරිතා සංවර්ධන වැඩ සටහන් හා වෙනත් ආයෝජන | | 10,013 | 13,250 | 76% |
| විශේෂ ව්‍යාපෘති - වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය | | 15,300 | 15,300 | 100% |
| **මුළු ප්‍රාග්ධන වියදම්** | | **43,602** | **47,050** | **93%** |
| | | | | |
| **මුළු වියදම්** | | **150,721** | **159,300** | **95%** |
| භාණ්ඩාගාර ප්‍රදාන | | | | |
| පුනරාවර්තන වියදම් | | 40,000 | 40,000 | 100% |
| ප්‍රාග්ධන වියදම් | | 19,874 | 30,000 | 66% |
| ව්‍යාපෘති | | 15,300 | 15,300 | 100% |
| **මුළු ප්‍රදාන** | | **75,174** | **85,300** | **88%** |

| ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දේපල පිරියත හා උපකරණ ලේඛනය | | | | | | | | | |
| විස්තරය | | ගොඩනැගිලි | උපකරණ | ලී බඩු | වාහන | යටිතල පහසුකම් වත්කම් | පුස්තකාල පොත් | | එකතුව |
| පිරිවැය | | | | | | | | | |
| 2016/01/01 දිනට | **1,726,876.68** | **154,570,375.53** | **15,327,679.42** | **9,685,360.25** | **26,044,302.19** | **15,058,193.88** | **2,247,148.40** | | **224,659,936.35** |
| එකතු කිරීම් | - | 10,382,641.98 | 7,487,903.82 | 1,838,754.50 | 8,900,000.00 | 3,238,573.36 | 202,603.60 | | **32,050,477.26** |
| මාරු කිරීම් | - | - | (6,930.00) | 6,930.00 | - | | - | | **-** |
| ප්‍රත්‍යාගණනය | - | - | - | - | - | | - | | **-** |
| ඉවත් කිරීම් | | | (607,732.29) | (194,682.86) | | | | | **(802,415.15)** |
| 2016/12/31 දිනට | **1,726,876.68** | **164,953,017.51** | **22,200,920.95** | **11,336,361.89** | **34,944,302.19** | **18,296,767.24** | **2,449,752.00** | | **255,907,998.46** |
| එකතු කිරීම් | - | 23,945,763.89 | 2,977,443.71 | 2,009,019.72 | 707,250.00 | 559,746.00 | 227,085.13 | | 30,426,308.45 |
| මාරු කිරීම් | - | | - | | | | | | |
| ප්‍රත්‍යාගණනය | - | - | - | - | (1,201,552.19) | | | | (1,201,552.19) |
| ඉවත් කිරීම් | - | - | (1,341,355.58) | (373,862.21) | (950,000.00) | | | | (2,665,217.79) |
| 2017/12/31 දිනට | **1,726,876.68** | **188,898,781.40** | **23,837,009.08** | **12,971,519.40** | **33,500,000.00** | **18,856,513.24** | **2,676,837.13** | | **282,467,536.93** |

| ක්ෂය වීම් | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **සමුච්චිත ක්ෂය** 2016/01/01 දිනට | **-** | **16,105,661.85** | **5,043,635.34** | **1,844,346.70** | **19,166,486.55** | **4,005,446.01** | **1,738,636.76** | | **47,904,213.21** |
| ක්ෂය පිරිවැය | - | 7,544,608.18 | 3,240,192.18 | 953,245.10 | 5,218,040.04 | 1,493,039.49 | 79,957.88 | | **18,529,082.87** |
| ඉවත් කිරීම් | | - | (531,997.26) | (58,406.97) | - | - | - | | **(590,404.23)** |
| ප්‍රත්‍යාගණන ගැලපීම් | - | - | - | - | - | - | - | | |
| මාරු කිරීම් | - | - | (539.21) | 539.21 | (17,042.23) | - | - | | **(17,042.23)** |
| **සමුච්චිත ක්ෂය** 2016/12/31 දිනට | **-** | **23,650,270.03** | **7,751,291.05** | **2,739,724.04** | **24,367,484.36** | **5,498,485.50** | **1,818,594.64** | | **65,825,849.62** |
| ක්ෂය පිරිවැය | - | 8,063,740.28 | 4,037,773.52 | 1,145,381.39 | 4,734,230.04 | 1,880,355.95 | 103,939.54 | | 19,965,420.72 |
| ඉවත් කිරීම් | - | - | (1,173,114.07) | (148,464.19) | (950,000.00) | - | - | | (2,271,578.26) |
| ප්‍රත්‍යාගණන ගැලපීම් | | - | - | - | (24,753,413.75) | - | - | | (24,753,413.75) |
| ගැලපීම් | | - | - | - | | - | - | | |
| **සමුච්චිත ක්ෂය** 2017/12/31 දිනට | **-** | **31,714,010.31** | **10,615,950.50** | **3,736,641.24** | **3,398,300.65** | **7,378,841.45** | **1,922,534.18** | | **58,766,278.33** |
| 2016/12/31 දිනට ශුද්ධ පොත් අගය | **1,726,876.68** | **141,302,747.48** | **14,449,629.90** | **8,596,637.85** | **10,576,817.83** | **12,798,281.74** | **631,157.36** | | **190,082,148.84** |
| 2017/12/31 දිනට ශුද්ධ පොත් අගය | **1,726,876.68** | **157,184,771.09** | **13,221,058.58** | **9,234,878.16** | **30,101,699.35** | **11,477,671.79** | **754,302.95** | | **223,701,258.60** |

| අස්පෘෂ්‍ය වත්කම් | | | | | |
|---|---|---|---|---|---|
| | ගිණුම්කරණ පරිගණක මෘදුකාංගය | පුහුණු මොඩියුල සංවර්ධන ක්‍රම පිරිවැය | පරිගණක දත්ත සැකසුම් පද්ධතිය | වත්කම් කළමනාකරණ මෘදුකාංගය | එකතුව |
| 2016/01/01 දිනට පිරිවැය | **209,500.00** | **1,307,746.79** | **240,000.00** | **500,000.00** | **2,257,246.79** |
| ගැලපීම් | - | - | - | - | - |
| අපහායනයන් | - | -- | - | - | - |
| නව අත්පත් කර ගැනීම් | - | 779,243.00 | - | - | 779,243.00 |
| 2016.12.31 දිනට පිරිවැය | **209,500.00** | **2,086,989.79** | **240,000.00** | **500,000.00** | **3,036,489.79** |
| ගැලපීම් | - | - | - | - | - |
| නව අත්පත් කර ගැනීම් | - | - | - | - | - |
| 2017.12.31 දිනට පිරිවැය | **209,500.00** | **2,086,989.79** | **240,000.00** | **500,000.00** | **3,036,489.79** |
| 2016.01.01 දිනට ක්‍රමක්ෂය | 137,490.00 | 624,375.00 | 120,000.00 | 125,000.00 | 1,006,865.00 |
| ගැලපීම | - | - | -- | - | - |
| ක්‍රමක්ෂය | 40,000.00 | 214,436.00 | 60,000.00 | 125,000.00 | 439,436.00 |
| 2016.12.31 දිනට ශේෂය | **177,490.00** | **838,811.00** | **180,000.00** | **250,000.00** | **1,446,301.00** |
| ක්‍රමක්ෂය | **32,000.00** | **351,122.00** | **59,990.00** | **125,000.00** | **568,112.00** |
| අපහායනයන් | | | | | |
| 2017.12.31 දිනට | **209,490.00** | **1,189,933.00** | **239,990.00** | **375,000.00** | **2,014,413.00** |
| ශුද්ධ උපලබ්ධි අගය 2016.12.31 දිනට | **32,010.00** | **1,248,178.79** | **60,000.00** | **250,000.00** | **1,590,188.79** |
| ශුද්ධ උපලබ්ධි අගය 2017.12.31 දිනට | **10.00** | **897,056.79** | **10.00** | **125,000.00** | **1,022,076.79** |

| | | 2017 | **2016** |
|---|---|---|---|
| 13 | **මුදල් හා මුදල් සමාන දෑ** | රු: | රු: |
| | | | |
| | ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව - 3697566 | 1,607,092.15 | 2,714,122.50 |
| | ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව - 8693502 | 1,715,000.00 | 1,715,000.00 |
| | ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව - 74689528 | 5,000,000.00 | 5,000,000.00 |
| | | **8,322,092.15** | **9,429,122.50** |

| | | | |
|---|---|---|---|
| 14 | **ලැබිය යුතු දෑ (කෙටි කාලීන)** | | |

| | | | |
|---|---|---|---|
| 14 (අ) | **වෙළඳ ලැබිය යුතු දෑ** | | |
| | කැලණිවැලි වැවිලි සමාගම | 52,000.00 | 7,500.00 |
| | ඇල්කඩුව වැවිලි සමාගම | 75,000.00 | 75,000.00 |
| | වැවිලි මානව සංවර්ධන භාරය | 194,880.55 | 164,901.40 |
| | වයඹ විශ්ව විද්‍යාලය | 2,075.00 | 2,075.00 |
| | ඇල්පිටිය වැවිලි සමාගම | 86,000.00 | - |
| | කම්කරු දෙපාර්තමේන්තුව | 17,042.29 | - |
| | තුරුසවිය අරමුදල | - | 18,070.00 |
| | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 253,226.59 | 1,851,688.31 |
| | තේ මණ්ඩලය | 945,139.00 | 20,800.00 |
| | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 27,369.50 | - |
| | ආගමන විගමන දෙපාර්තමේන්තුව | 314,812.90 | - |
| | කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන | - | 1,765,000.00 |
| | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 209,015.00 | 5,661.00 |
| | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | - | 14,787.25 |
| | සී. ඩී. මාගින ආරච්චි මිය - දුරකථන | 2,191.65 | - |
| | සී. ඩී. පතිනායක මයා | 2,820.00 | - |
| | තේ පර්යේෂණ ආයතනය | 255,106.00 | 181,220.00 |
| | පාඨමාලා ගාස්තු | 324,500.00 | 738,110.69 |
| | ඩී. එස්. වී. කුමාර මයා | - | 1,215.00 |
| | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 1,141,000.00 | - |
| | නිරෝෂන් මහතා | 76,995.00 | - |
| | ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය | - | 145,600.00 |
| | රජරට විශ්ව විද්‍යාලය | 195,000.00 | - |
| | මහාමායා විද්‍යාලය | 33,142.83 | - |
| | මහාමාත්‍ය විද්‍යාලය - අතුරුගිරිය | 90,000.00 | - |
| | පිමා හෝල්ඩින්ස් පුද්ගලික ආයතනය | 121,571.50 | - |
| | කාන්තා ක්‍රියාකාරී සංවිධානය | - | 57,078.18 |
| | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | - | 240,000.00 |
| | ටී. ටී. ආර්. එම්. රාජ් මහතා | - | 5,752.00 |
| | එච්. එම්. රත්නසිංහ මහතා | - | 5,875.00 |

| | | | |
|---|---|---|---|
| | සී. බී. ලංකා මයික්‍රො ක්‍රෙඩිට් ආයතනය | 45,366.54 | - |
| | යු. එන්. පී. පෙරේරා මයා | 3,050.00 | - |
| | කේ. එම්. හේමසිරි මහතා | - | 10,650.00 |
| | ගයාන් සුජීව මයා | 9,200.00 | - |
| | චන්දිමාල් තිසේරා මයා | 57,599.60 | - |
| | **මුළු ණයගැතියන්** | **4,534,103.95** | **5,310,983.83** |
| | අඩු කලා - අඩමාණ ණය වෙන් කිරීම | 272,046.24 | 318,659.00 |
| | **ශුද්ධ මුළු වෙළඳ ලැබිය යුතු දෑ** | **4,262,057.71** | **4,992,324.83** |

| | | | |
|---|---|---|---|
| 14(ආ) | **සේවක අත්තිකාරම් සහ ණය** | | |
| | ආපදා ණය | 1,695,357.45 | 1,388,367.84 |
| | උත්සව ණය | 10,000.00 | 21,450.00 |
| | විශේෂ අත්තිකාරම් | - | 4,000.00 |
| | **මුළු සේවක අත්තිකාරම් සහ ණය** | **1,705,357.45** | **1,413,817.84** |
| | | | |
| | වර්ෂයේ ආරම්භක ශේෂය | **2,839,141.98** | **2,845,061.62** |
| | සේවක ණය නිකුත් කිරීම | 2,958,470.00 | 1,976,280.00 |
| | සේවක ණය නැවත ගෙවීම් | (2,529,143.67) | (1,982,199.64) |
| | **වසර අවසානයේදී ශේෂය** | **3,268,468.31** | **2,839,141.98** |
| | කෙටි කාලීන ණය සහ අත්තිකාරම් | 1,705,357.45 | 1,413,817.84 |
| | දිගු කාලීන ණය සහ අත්තිකාරම් | 1,563,110.86 | 1,425,324.14 |
| (ඇ) | වෛද්‍යාධාර යෝජනා ක්‍රමයෙන් ලද මුදල | 545,242.57 | - |
| | කෙටි කාලීන මුළු ලැබීම් | **6,512,657.73** | **6,406,142.67** |

| | | | |
|---|---|---|---|
| 15 | **තොගයන්** | | |
| | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 327,107.26 | 175,902.65 |
| | මුද්‍රණ උපකරණ | 697,479.00 | 343,131.50 |
| | නඩත්තු උපකරණ | 57,495.00 | 100,622.00 |
| | ටයර් සහ ටියුබ් | 30,893.00 | 30,893.00 |
| | සුභ සාධන උපකරණ | 41,280.00 | 10,314.00 |
| | පාරිභෝජන ද්‍රව්‍ය | 48,537.00 | 24,724.00 |
| | ආයතන ප්‍රකාශනයන් | 370,281.70 | 425,053.12 |
